# වාර්ෂික වාර්තාව
# ஆண்ட றிக்கை
# ANNUAL REPORT

# 2021




**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව**

**விஞ்ஞான மற்றும் தொழில்நுட்ப ஆணைக்குழு**

**National Science and Technology Commission**

# ජාතික විද්‍යා  හා තාක්ෂණ කොමිෂන් සභාව

**වාර්ෂික වාර්තාව 2021**

NASTEC

# ස්තුතිය

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු උදෙසා අවශ්‍ය පහසුකම් හා මූල්‍ය සහාය ලබාදීම වෙනුවෙන් තාක්ෂණ අමාත්‍යාංශය වෙත හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය වෙත කළමනාකාරිත්වය විසින් සිය කෘතඥතාවය පළ කරනු ලබයි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු සිදු කිරීමෙහි ලා එහි කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ලබාදුන් සහාය හා උපකාරය කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන් විසින් අගය කොට සලකනු ලබයි.*

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති සම්පාදනය කරන හා උපදෙස් සපයන ප්‍රමුඛතම ආයතනය ලෙස නම් කරනු ලැබ ඇත. කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.

### පරිශ්‍රයේ ලිපිනය

හයවන මහල, D කොටස, "සෙත්සිරිපාය" II වන අදියර,
බත්තරමුල්ල

### ඇමතුම් තොරතුරු

011- 2186711

011- 2186713

info@nastec.gov.lk

www.nastec.gov.lk

ලංකා බැංකුව, හයිඩ් පාක්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

# පටුන

පිටු අංක


ස්තුතිය ....................................................................................................................................................2

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව ...................................................................................3

පරිශ්‍රයේ ලිපිනය .........................................................................................................................................3

රූප සටහන්.................................................................................................................................................5

(1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන්..................................6

අපගේ මෙහෙවර .........................................................................................................................................6

අපගේ දැක්ම................................................................................................................................................6

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ........................................................................................8

සංවිධාන ව්‍යුහය ...........................................................................................................................................9

සභාපතිවරයාගේ සමාලෝචනය......................................................................................................................10

කොමිෂන් සභාවේ සාමාජිකයෝ .....................................................................................................................12

මහා භාණ්ඩාගාර නියෝජිතයෝ......................................................................................................................13

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2021 .................................................................14

කාර්ය සාධනයේ කඩඉම් - 2021 .....................................................................................................................15

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම ....................................................................15*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම.....................................................................16*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය ..............................................................................................................................................16*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): ආයතනවලට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජය දැනුවත් කිරීමට පෙර අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්ගේ අදහස් විමසීම...................................20*

ජාත්‍යන්තර කටයුතු.....................................................................................................................................26

*නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre) ...........................................................................................................................................26*

මානව සම්පත් කළමනාකරණය ......................................................................................................................30

කාර්ය මණ්ඩල පුවත්.....................................................................................................................................31

ධාරිතා වර්ධනය / ගෘහස්ථ හා බාහිර පුහුණු වැඩසටහන්.....................................................................................31

සුබසාධන කටයුතු........................................................................................................................................32

විදේශ පුහුණු/ වැඩමුළු/ සමුළු/ සම්මන්ත්‍රණ සඳහා සහභාගිත්වය .........................................................................32

මූල්‍ය ප්‍රකාශන ............................................................................................................................................33

විගණකාධිපති වාර්තාව ................................................................................................................................35

# රූප සටහන්


රූපය 1: පනත හා නීති, දැක්ම හා මෙහෙවර ........................................ 06
රූපය 2: සංවිධාන ව්‍යුහය ........................................ 09
රූපය 3 : රබර් පර්යේෂණ ආයතනයේ (RRI) කාර්ය සාධනය ........................................ 19
රූපය 4 : පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ (ROP) කාර්ය සාධන සමාලෝචනය ........................................ 20
රූපය 5 : ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුවක් ........................................ 21
රූපය 6 : බුද්ධිමය දේපළ නිමැවුම හා ආරක්ෂණය සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 22
රූපය 7 : සමුද්‍රික ප්ලාස්ටික් දූෂණය හා ජලජ ජීවීන් කෙරෙහි ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වීමේ බලපෑම් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 23
රූපය 8 : කොවිඩ් 19 එන්නත් හා ප්‍රභේද සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 23
රූපය 9 : ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපාදන ලබාගන්නා ආකාරය සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 24
රූපය 10 : දකුණු ආසියාවේ න්‍යෂ්ටික සංකීර්ණතාවයන් පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 24
රූපය 11 : නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා රැස්වීම ........................................ 27
රූපය 12 : 15වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම ........................................ 28
රූපය 13 : ‘සමාජාර්ථික සංවර්ධනය උදෙසා වූ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තිය’ පිළිබඳ වූ මාර්ගගත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන ........................................ 31
රූපය 14 : ‘විවිධත්වයෙන් යුත් පුද්ගලයන් කළමනාකරණය සඳහා මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීම’ පිළිබඳ වූ මාර්ගගත සම්මන්ත්‍රණය ........................................ 32

## (1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන්

**පනත හා නීති**

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලද අතර, 1998 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වේ. 1998 දෙසැම්බර් මස 06 වන දින විධිමත් පරිදි අරඹන ලද එය 1999 ජනවාරි මාසයේදී සක්‍රීය කොමිෂන් සභාවක් බවට පත්විය.**

**දැක්ම**

**අපගේ දැක්ම**

"ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත හා සමෘද්ධිය නංවාලනු පිණිස වූ විභවතාව හා ඒ සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සඳහා රජයට උපදෙස් ලබාදෙන අති විශිෂ්ට උපදේශනායතනයක් බවට පත්වීම."

**මෙහෙවර**

**අපගේ මෙහෙවර**

"තිරසර සංවර්ධනය උදෙසා යොදාගනු පිණිස විද්‍යා හා තාක්ෂණ අංශයන්ගේ උසස් ජාතික හැකියාවන් ගොඩනැගීම උදෙසා රජය වෙත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය"

පහත සඳහන් ක්ෂේත්‍රයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම්ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම:

- ආර්ථික වෘද්ධිය උත්තේජනය කරනු පිණිස විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
- කර්මාන්ත, කෘෂිකර්ම, සේවා හා ආර්ථික ක්ෂේත්‍රයනට අදාළ කාර්යක්ෂමතාවය හා තරඟකාරිත්වය සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ බලපෑම;
- ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනු පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දුගීබව දුරුලීම යන ක්ෂේත්‍රයන් මත විද්‍යාවේ හා තාක්ෂණයේ බලපෑම;
- අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතුවන බලධාරීන් විමසමින් විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය මානව හා සෙසු සම්පත් සංවර්ධනය;
- ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
- ජාතික වැදගත්කමකින් යුතු විය හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය;
- විද්‍යා හා තාක්ෂණ ප්‍රවීණත්වය ගොඩනැගීම, පවත්වා ගැනීම හා ආකර්ශනය සඳහා තුඩු දෙන පරිසරයක් නිර්මාණය කිරීම;
- විද්‍යාව හා තාක්ෂණය ඵලදායි ලෙස යෙදාගැනීම සඳහා තුඩුදෙන කළමනාකරණ ක්‍රමෝපායන් ස්ථාපනය;
- විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල්කරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම.

පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියා මාර්ගයන්හි ඵලදායිතාවය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්යසාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ රජයේ වියදම්හි ඵලදායිතාවය හා රාජ්‍ය අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම;

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 2 වන කොටස තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණික ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය;

විද්‍යා හා තාක්ෂණික ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ එවන් ආයතනයන්හි අදහස් විමසීම;

අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවා පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සංසදයක් ඇති කිරීම ; හා එම සාකච්ඡාවන් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ


- *සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.*

- *අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ.*

- *ආංශික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සැලසුම් හා සෙසු විද්‍යා හා තාක්ෂණ ආශ්‍රිත ලේඛන සකසා ඉදිරිපත් කරනු වස් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් හා විද්‍යාඥයන් බාහිර පාර්ශවකරුවන් හා උපදේශක සංසද සමග කටයුතු කරති.*

- *පනත මගින් බලය ලබාදී ඇති පරිදි විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ආයතනික සමාලෝචන කාර්යයන් සිදුකරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් පෙළ ගස්වනු ලබයි.*

## සංවිධාන ව්‍යුහය




*රූපය 2: සංවිධාන ව්‍යුහය*

## සභාපතිවරයාගේ සමාලෝචනය

විද්‍යා හා තාක්ෂණ කරුණු කාරණා සම්බන්ධයෙන් රජයේ ප්‍රධානතම ප්‍රතිපත්ති සම්පාදක හා උපදේශනායතනය වන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින්, විශේෂයෙන් තාක්ෂණය මත පදනම් වූ ආර්ථිකයක් සඳහා, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන මූලාරම්භයන් ඉදිරියට ගෙන ඒමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍යයන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් තේමාමාත්මක ක්ෂේත්‍රයන් පහ යටතේ සංවිධිතය: ඒවා නම්, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන කටයුතු විෂයයෙහිදී රජයට උපදෙස් ලබාදීම; විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ආයතනික සමාලෝචනයන්; විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තා සකස් කිරීම;විද්‍යා හා තාක්ෂණ අංශයන් සහ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ ද්වි වාර්ෂික සමුළුව ප්‍රවර්ධනය කරනු පිණිස විවිධ උපදේශනාත්මක සංසදයන් හරහා විද්‍යාඥයන් හා ඉංජිනේරුවන් පෙළ ගැස්වීම වශයෙනි. මෙයට අමතරව, නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අදාළ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය හරහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් එහි ජාත්‍යන්තර සම්බන්ධතාවය පවත්වාගෙන යනු ලබයි.

ජාතික ප්‍රතිපත්ති රාමුව හා අනුගතව ආර්ථිකමය වශයෙන් වැදගත් විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන මූලාරම්භයන් ගණනාවක් ක්‍රියාත්මක කරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සැලසුම් කරන ලද නමුදු, සැලසුම්ගත පරිදි එකී කටයුතු සිදු කිරීම කෙරෙහි කොවිඩ් 19 වසංගතය විසින් දැඩි බලපෑමක් එල්ල කරන ලදී. කෙසේ වුවද, කොවිඩ් 19 ව්‍යාප්තියද ඇතුළු බොහෝ අභියෝග මධ්‍යයේ 2021 වසර තුළ සැලකිය යුතු ප්‍රගතියක් සාක්ෂාත් කරගැනීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට හැකිවිය.

ස්වකීය ප්‍රතිපත්ති උපදේශන කාර්ය භාරයෙහි කොටසක් වශයෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින්, ජාතික ප්‍රතිපත්ති රාමුව හා අනුගතව, ප්‍රමුඛතාගත ප්‍රතිපත්තිමය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමේ කාර්යයෙහි නොකඩවා නියැළිණි. ඒ අනුව, 2008දී ගොඩනඟන ලද විද්‍යාව හා තාක්ෂණයට අදාළ ජාතික ප්‍රතිපත්තිය හා 2016 දී ගොඩනඟන ලද ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව නැවත සලකා බැලීමට කටයුතු කරන ලදී. මෙම සමාලෝචනය මත පදනම්ව, අදාළ පාර්ශවකරුවන් විමසමින් නව විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්තියක් ගොඩනඟනු ඇත. මෙයට අමතරව, දේශීය බීජ ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාවය හා දේශීය වෛද්‍ය/ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් නිර්මාණය කරනු පිණිස අවශ්‍ය වන්නාවූ දේශීය පැතිකඩයන් ඇතුළත් කරනු සඳහා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇත. මෙම ප්‍රතිපත්තිමය නිර්දේශ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සිදු කරන ආයතනික සමාලෝචනය මත පදනම් වේ.

වරින් වර සිදුවූ රට අගුලු දැමීම් හා සංචරණ සීමාකරණයන් මධ්‍යයේ වුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට ආයතනික සමාලෝචනයන් පහක් සම්පූර්ණ කිරීමට හැකිවූ අතර, 2021 වසර තුළ තවත් සමාලෝචනයක් ආරම්භ කරමින් පවත්නා බව සතුටින් සඳහන් කරමි. විවිධ පර්යේෂණ හා සංවර්ධන ආයතන වෙත ඉල්ලීම් දහයකට වැඩි සංඛ්‍යාවක් යවා ඇති නමුදු මේ දක්වාද කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. සමාලෝචනය ආරම්භ කිරීමෙහි පදනම්ගත ලේඛනය වන ස්වයං තක්සේරු වාර්තාව ඉදිරිපත් කිරීම විෂයයෙහි පර්යේෂණ හා සංවර්ධනායතනයන්ගෙන් ලැබෙන ප්‍රතිචාරය ප්‍රමාණවත් නොවීම ආයතනික සමාලෝචන කටයුතු ඉදිරියට ගෙන යාමෙහි ලා පවත්නා ප්‍රධාන බාධකය වන බව සටහන් කළ යුතුය. ඒ ආයතනය වෙතින් අවසන් වලංගුකරණයක් ඉදිරිපත් කිරීමෙහි ලා වන ප්‍රමාදයන්ද ප්‍රගතිය මන්දගාමී කරවන සුළු වූ තවත් සාධකයකි. මේ සම්බන්ධයෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත නීතිමය වරප්‍රසාදයක් ලබාදීම මගින් විද්‍යා, තාක්ෂණ

හා නවෝත්පාදන අංශයේ කාර්යසාධනය නංවාලන අතර සමස්ත සමාලෝචන ක්‍රියාවලියද බලගැන්වෙනු ඇත.

විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන අංශය ප්‍රවර්ධනය කිරීම උදෙසා විවිධ සාකච්ඡා සංසදයන් හරහා විද්‍යාඥයන් හා ඉංජිනේරුවන් පෙළ ගැස්වීම ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සිදු කරන වැදගත් කාර්යයන් අතරින් එකකි. විද්‍යා හා තාක්ෂණ කාර්යයන්හි තරුණ විද්‍යාඥයන් හා ඉංජිනේරුවන් පෙළ ගැස්වීම ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF) හරහා සිදුවේ. 2021 වසර තුළ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට සමාන්තර තාක්ෂණික සැසි හතක් හරහා දීර්ඝ සාරාංශයන් 51ක් පළ කිරීමේ අවස්ථාව තරුණ විද්‍යාඥයන් වෙත ලබා දෙමින් තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ 9 වන සමුළුව සාර්ථකව සංවිධානය කිරීමට හැකිවිය. ඉල්ලුම මගින් යොමු කෙරුණු පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කෙරෙහි තරුණ විද්‍යාඥයන් දිරි ගන්වනු පිණිස කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් පර්යේෂණ හා තාක්ෂණය සඳහා නව පර්යේෂණ ප්‍රදානයක්ද අනුමත කෙරිණි. මෙයට අමතරව, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් ජාතික ප්‍රමුඛතාවයන් හා අනුගතව ප්‍රතිපත්තිමය අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට සහාය වීම සඳහා පෙළ ගැස්වීමේ අරමුණින් වසර 10ක් පුරා අක්‍රියව පැවති ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය (SSF) ද නැවත ක්‍රියාත්මක කරන ලදී.

නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ හා සෙසු රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ (NAM S & T Centre) කේන්ද්‍රීය මධ්‍යස්ථානය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වේ. නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ හා සෙසු රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය, විද්‍යා හා තාක්ෂණ විෂයයන් සම්බන්ධ දකුණු-දකුණු සහයෝගිතාවය ප්‍රවර්ධනය කරනු වස් අප්‍රිකානු, ආසියානු, යුරෝපානු හා ලතින් ඇමරිකානු කළාපයන්හි විහිදී සාමාජික රටවල් 47ක නියෝජනයක් සහිත ආයතනයකි. මෙම අන්තර් රාජ්‍ය යාන්ත්‍රණය හරහා සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වන්නා වූ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගිතාවය ප්‍රවර්ධනය කරමින් සාමාජික රටවල් අතර ජාතික හා කළාපීය විද්‍යාත්මක ජාලයන් සමග සම්බන්ධතාවයන් නිර්මාණය කරවනු ලබයි. ශ්‍රී ලංකාවට 2021 වසරේ නොබැඳි ජාතීන්ගේ සංවිධානයේ හා සෙසු රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා (GC) රැස්වීමේ සත්කාරකත්වය දැරීමේ වගකීම පැවරිණි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට 2021 පෙබරවාරි මස 24වන දින අතිගරු ජනාධිපතිතුමන්ගේද සහභාගිත්වයෙන් පැවති 15වන පාලක සභා රැස්වීමෙහි සත්කාරකත්වය සාර්ථකව දැරීමට හැකිවිය. සාමාජික රටවල් 20කගේ සහභාගිත්වය සහිතව 15වන පාලක සභා රැස්වීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද අතර, ශ්‍රී ලංකාවේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා 2021-2023 කාල වකවානුව සඳහා 15වන පාලක සභාවේ සභාපතිවරයා වශයෙන් පත්කරන ලදී.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට බොහෝ අභියෝග මධ්‍යයේ සිය විධි නියමයට අදාළ කටයුතු ඉටු කිරීමට හැකිවූ නමුදු, එම විධි නියමය සපුරාලනු පිණිස පූර්ණ කාලීන ප්‍රධාන විධායක නිලධාරියෙකුගේ දැඩි අවශ්‍යතාවයක් පවත්නා බැවින් දැනට සිදු කෙරෙමින් පවතින අභ්‍යන්තර විනය පරීක්ෂණය ප්‍රමුඛතා පදනමෙහි ලා නිමකළ යුතුව පවත්නා ගැටලුවකි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට සමස්ත වසර පුරා සභාපතිවරයෙකු නොසිටීම ඉතා කණගාටුදායක තත්ත්වයක් වන අතර, ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාල වකවානුව පුරා සාමාජික තනතුරක්ද පුරප්පාඩුව පැවතිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොමිෂන් සභාවට බොහෝ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ හැකියාවක් නොතිබීම තුළ එහි ප්‍රගතියට සැලකිය යුතු මට්ටමකින් බාධා එල්ල විය.

කොමිෂන් සභා සාමාජිකයන් විසින් ලබාදුන් අඛණ්ඩ සහාය හා උපදෙස් මෙන්ම විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් 2021 වසර තුළ අදාළ කටයුතු සම්පූර්ණ කිරීමෙහි ලා දක්වන ලද දායකත්වයද අවංකව අගයමි.

නසීමා අහමඩ් - වැ.බ. අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි. (සභාපති වෙනුවට)

# කොමිෂන් සභාවේ සාමාජිකයෝ



**මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු , කොමිෂන් සභා සාමාජික**

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියකි.



**මහාචාර්ය සුදත් රෝහණ මුණසිංහ, කොමිෂන් සභා සාමාජික**

වරලත් ඉංජිනේරුවරයෙකු වන මහාචාර්ය රෝහණ මුණසිංහ මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යුත් හා විදුලි සංදේශ අධ්‍යයනාංශයට අනුයුක්තව සේවය කරයි.



**ආචාර්ය රවී ලියනගේ, කොමිෂන් සභා සාමාජික (2020 ජනවාරි මස 23 වන දින සිට 2021 දෙසැම්බර් මස 15වන දින දක්වා)**

ආචාර්ය රවී ලියනගේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආහාර, පුද්ගලික සත්කාර හා ගෘහභාණ්ඩ නිෂ්පාදන සමාගමක් වන Kindom of Raigam සභාවේ සමාරම්භක, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියා වේ.



**මහාචාර්ය රේණුකා නිල්මිණී, කොමිෂන් සභා සාමාජික**

මහාචාර්ය ඒ.එච්.එල්.ආර්. නිල්මිණී මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨාධිපතිනිය වේ.



කොමිෂන් සභාවේ සභාපති ධූරය හා එක් සාමාජික ධූරයක්ද 2021 ජනවාරි මස පළමුවනදා සිට පුරප්පාඩුව පවතී.

**රුවන් කුකුලෙවිතාන මහතා, කොමිෂන් සභා සාමාජික**

රුවන් කුකුලෙවිතාන මහතා RH Steel Building Systems පුද්ගලික සමාගමේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වේ.

## මහා භාණ්ඩාගාර නියෝජිතයෝ



**ධර්ෂිණි ප්‍රසාන්ත් මහත්මිය, (2021 පෙබරවාරි මස 21 දින සිට 2021 සැප්තැම්බර් මස 22වන දින දක්වා)**

ධර්ෂිණි ප්‍රසාන්ත් මහත්මිය 2021 සැප්තැම්බර් මස 22 වන දින දක්වා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස කටයුතු කරයි.



**ආචාර්ය ඩී.ජී.ජී.එස්. දයානාත් මහතා (2021 සැප්තැම්බර් මස 22 වන දින සිට)**

ආචාර්ය ඩී.ජී.ජී.එස්. දයානාත් මහතා 2021 සැප්තැම්බර් මස 22වන දින සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාර නියෝජිතවරයෙකු ලෙස සේවය කරයි.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2021

| | |
|---|---|
| **2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා පුරප්පාඩුව පවතී** | **සභාපති** |
| **නසීමා අහමඩ් මහත්මිය** | වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2020 ජුනි මස පළමුවැනිදා සිට) |
| **සෙයිඩ් ශහමි මහතා** | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ |
| **ජී.සී.කුමාරි පීරිස් මහත්මිය** | නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් හා පාලන |
| **එම්.ඩී. තිළිණි මිය** | විද්‍යාඥ |
| **රසිතා පෙරේරා මහත්මිය** | විද්‍යාඥ |
| **යූ.කේ.ඩී.එල්.එච්.කේ. උඩුගම මිය** | පරිපාලන නිලධාරී |
| **එස්.ඒ.ඩී.එස්.පී. සේනානායක මහතා** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/දත්ත නිලධාරී |
| **ආර්.එම්.ටී. රත්නායක මහතා** | වැඩසටහන් සහකාර - මුදල් |
| **ජී.එම්.සී.එන්. මහරගේ මහත්මිය** | කළමනාකරණ සහකාර |
| **ඩබ්.එම්.අයි.කේ. වෙදමුල්ල මහත්මිය** | කළමනාකරණ සහකාර |
| **අනිල් හෙට්ටිආරච්චි මහතා** | රියැදුරු |
| **ජයශාන්ත ප්‍රභාත් මහතා** | රියැදුරු |
| **එරන්ද ප්‍රදීප් මහතා** | රියැදුරු |
| **ඒ.ඩී. ධනපාල මහතා** | කාර්යාල කාර්ය සහායක |

# කාර්යසාධනයේ කඩඉම් - 2021

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම*

### 01. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම අංශයේ පළතුරු හා එළවළු භෝග සඳහා වූ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්‍රියාකාරී සැලැස්ම - 2021-2025

හඳුනාගනු ලැබූ ප්‍රමුඛතාගත ක්ෂේත්‍රයන් සඳහා විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති ලේඛන ගොඩනැඟීම සඳහා 2020-2021 දී කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) විමසමින් සිදුකරන ලද ඒකාබද්ධ ව්‍යාපෘතියකි. කොවිඩ් 19 හේතුවෙන් කෘෂිකර්මය මත ඇතිකරන ලද හානිකර බලපෑම හේතුකොට, ඵලදායිතා, ක්‍රියාවලි හා ව්‍යවසායකත්ව සංවර්ධනය නංවාලීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කෘෂිකර්ම අංශය වෙනුවෙන් කටයුතු කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව හා විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය එකඟ විය. ඒ අනුව, කෘෂිකාර්මික ඵලදායිතා, ක්‍රියාවලි හා ව්‍යවසායකත්ව සංවර්ධනය නංවාලනු පිණිස ක්‍රියාකාරී සැලසුම් ගොඩනැගීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් කොරියානු උපදේශකවරුන් හා දේශීය උපදේශකවරුන් තිදෙනෙකු සමග කටයුතු ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය හා ඒකාබද්ධව දේශීය උපදේශකවරුන් විසින් ක්‍රියාකාරී සැලසුම් ගොඩනගන ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට, මුල් අදියරේදී කොරියානු උපාය මාර්ගික මෙවලම් ඇතුළත් කිරීමට සැලසුම් කොට තිබුණද, නිසි කාල රාමුව තුළ අවශ්‍ය සේවාවන් ලබාගැනීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට නොහැකි විය. ඉදිරි කටයුතු සඳහා සලකා බලනු පිණිස කෙටුම්පත් සැලැස්ම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

### 02. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළට දේශීය දැක්ම අන්තර්ග්‍රහණය කිරීම

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද ආයතනය සමාලෝචන කාර්යයෙහි නියැළි සමාලෝචක මණ්ඩලය විසින් ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට දේශීය සෞඛ්‍ය/ ආයුර්වේද ප්‍රතිපත්ති අංග ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් පවත්නා බවට නිගමනය කරන ලදී. සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රකාශිත පරිදි, මෙමගින් දේශීය වෛද්‍ය/ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසෙනු ඇත. සමාලෝචක මණ්ඩලය විසින් සොයාගත් කරුණු හා කරන ලද නිර්දේශ මත පදනම්ව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් දැනටමත් යෝජිත ප්‍රතිපත්තිමය අවශ්‍යතාවයන් පිළිබඳ සෞඛ්‍ය අංශයේ සුදුසු බලධාරීන් වෙත දැනුම්දීම් සිදුකර ඇති අතර, යෝජිත ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව සමගින් සාකච්ඡා ආරම්භ කර ඇත.

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම*

මිට පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්ෂිකව රජයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට පවරා ඇත. මෙම වාර්තාව තුළට මානව සම්පත් සංවර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය; විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධනය; විද්‍යා හා තාක්ෂණ විෂයයන් සඳහා රජයේ වියදම්වල ඵලදායකත්වය; හා රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ කටයුතු සඳහා විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගැනීම පිළිබඳ තක්සේරු කිරීම ඇතුළත් වේ.

### 01. <u>විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2019-2020</u>

විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා සමගින් පවත්වන ලද රැස්වීමකදී ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් 2019-2020 සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. එයට හේතුවූයේ දත්ත රැස් කිරීමේ ආකෘතියේ වෙනස්කම්, දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම්, දත්ත රැස් කිරීම සමාන සෙසු ආයතන සමග සම්බන්ධ කිරීම, හා වාර්තාකරණ ආකෘතිය ආදියේ සිදු කළ වෙනස්කම් හේතුවෙනි. ඒ අනුව දත්ත රැස් කිරීමට නව ආකෘතියක් හා දත්ත රැස් කිරීමේ මෙවලම් යොදා ගන්නා ලදී. එම දත්ත රැස් කිරීමේ මෙවලම් අවශ්‍ය දත්ත රැස් කරනු පිණිස විද්‍යා හා තාක්ෂණායතන හැටකට පමණ යවන ලදී. ඊට අමතරව වරින් වර සිදුවූ රට අගුලු දැමීම් හා කාර්යාල වසා දැමීම් හේතුකොටගෙන දත්ත රැස් කිරීමේ කාර්යය අපේක්ෂිත මට්ටමින් සිදු නොවූ අතර, ඒ හේතුවෙන්ද වාර්තාව පළ කිරීම ප්‍රමාද විය. ඒ අනුව 2022 වසර දක්වා වාර්තාව පළ කිරීම කල් දැමීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට සිදු විය.

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය*

පනතේ 2වන වගන්තිය තුළ පනවා ඇති අරමුණු ආශ්‍රිතව විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි සමාලෝචනය කිරීමේ කාර්යය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත පවරා ඇත.

මෙම සමාලෝචනයන් මෙම ආයතනයන් විසින් ජාතික ප්‍රමුඛතා හා ඉලක්කයන් සපුරාලන බවට තහවුරු කරගනු පිණිස ඒවා විසින් සිදුකරන විද්‍යා හා තාක්ෂණ කටයුතුවල ගුණාත්මකභාවය, පිරිවැය ඵලදායකත්වය, අදාළත්වය, හා බලපෑමද අගයනු වස් අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සැදුම් ලත් හා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද විශේෂඥ මණ්ඩලයන් විසින් සිදු කෙරේ. මෙම සමාලෝචනය අදාළ ආයතනයන් විසින් ඉදිරිපත් කරනු ලබන අත්පොත හා ස්වයං - තක්සේරු වාර්තාව මත පදනම්ව සිදු කෙරේ. බාහිර පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම් හරහා අතිරේක තොරතුරු රැස් කිරීමද මෙහිදී සිදු කරනු ලැබේ.

මෙම සමාලෝචන ක්‍රියාවලිය තුළ අදියර හතරක් පවතී:

- සමාලෝචන කාර්යය සඳහා සූදානම් වීම;
- සමාලෝචන කණ්ඩායම ආයතනයන් වෙත යාම;
- සමාලෝචන කණ්ඩායම විසින් කෙටුම්පත් වාර්තාව සකස් කිරීම; හා
- සමාලෝචන කමිටුව විසින් අවසන් සමාලෝචන වාර්තාව අනුමත කොට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත භාරදීම වශයෙනි.

අදාළ ක්‍රියාවලිය ක්ෂේත්‍ර නිරීක්ෂණ හා සාකච්ඡා මත පදනම් වන බැවින්, 2021 විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්යසාධන සමාලෝචන කාර්යයට කොවිඩ් 19 තත්ත්වය මගින් සැලකිය යුතු බලපෑමක් ඇතිවිය.

රට අගුලු දැමීම්, සංචාරක සීමා පැනවීම හා පෞද්ගලිකව හමුවීම් සීමා කිරීම යන සියල්ල සමාලෝචන ක්‍රියාවලිය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචන වාර්තාවල අදහස් හා කරුණුමය පැහැදිලි කරගැනීම් වලට ප්‍රතිචාර දැක්වීම හා අවසන් වාර්තා අනුමත කරගැනීම වැනි කාර්යන් වලදී විද්‍යා හා තාක්ෂණ ආයතනයන් මගින් විවිධාකාර ප්‍රමාදයන් සිදු විය. කෙසේ වුවද, 2020 වසරේ දෙවන කාර්තුවේ ආරම්භ කරන ලද පහත සඳහන් ආයතනික සමාලෝචනයන් 2021 දී සිදු කොට අවසන් කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට හැකිවිය.

1. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD)
2. ජාතික විද්‍යා පදනම (NSF)
3. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)
4. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)
5. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
6. රබර් පර්යේෂණ ආයතනය (RRI)
7. පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය (ROP)

උක්ත වාර්තා අනුමැතිය පිණිස කොමිෂන් සභාව වෙත 2022 වසරේදී ඉදිරිපත් කිරීමට නියමිතය.

විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්යසාධන සමාලෝචනයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

### 1. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 වසර තුළ ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි සමාලෝචන කාර්යය ආරම්භ කරන ලද අතර, සමාලෝචන කාර්යය සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයන් පත් කරනු ලැබ ඇත:

1. මහාචාර්ය ආනන්ද ජයවර්ධන මහතා (සභාපති)
2. ශිරෝමාල් ප්‍රනාන්දු මහතා
3. මහාචාර්ය බුද්ධික පී ජයසේකර මහතා

මණ්ඩලය විසින් 2021 අප්‍රේල් මාසයේදී සිය කෙටුම්පත් වාර්තාව භාරදෙන ලද අතර, එහි අඩංගු කරුණු සනාථ කරගැනීමේ කාර්යය තුළ ලද අදහස් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, අවසන් අනුමැතිය පිණිස සමාලෝචන මණ්ඩලය විසින් 2021 ජුනි මාසයේදී අදාළ වාර්තාව ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත භාරදෙන ලදී. 2021 දෙසැම්බර් මස NERDC ආයතනයෙන් වාර්තාවේ අඩංගු කරුණු සම්බන්ධ එකඟතාවය ලැබුණු අතර, මෙම වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය උදෙසා 2022 වර්ෂයේදී ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

### 2. ජාතික විද්‍යා පදනම (NSF)

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 අගෝස්තු මස 20වන දින ජාතික විද්‍යා පදනමට අදාළ සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. සමාලෝචන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත වේ:

1. මහාචාර්ය මංජුල පී.එස්. මාගමගේ මහතා (සභාපති)
2. මහාචාර්ය තියඩෝර් ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු මහතා
3. ශාන්ත වීරසිංහ මහතා.

මණ්ඩලය විසින් කෙටුම්පත් වාර්තාව 2021 ඔක්තෝබර් මාසයේදී ඉදිරිපත් කරන ලද අතර, ජාතික විද්‍යා පදනම විසින් සිය අදහස්ද සමගින් 2021 දෙසැම්බර් මාසයේදී එයට ප්‍රතිචාර දක්වන ලදී. ඒ අනුව 2022 වසරේදී මෙම වාර්තාව කොමිෂන් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**3. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)**

පහත අයගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයක සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයට අදාළ සමාලෝචන කාර්යය 2020 අගෝස්තු මස 12වන දින ඇරඹිණි:

1. මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ මහතා (සභාපති)
2. මහාචාර්ය පී.ජී.ආර්. ධර්මරත්න මහතා
3. ආචාර්ය අතුල සේනාරත්න මහතා

සමාලෝචන මණ්ඩලය වෙත කෙටුම්පත් සමාලෝචන වාර්තාව 2021 මැයි මස ලැබුණු අතර,ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් 2021 ජූනි මාසයේදී අදහස් ඉදිරිපත් කරන ලදී. මණ්ඩලය හා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්වුණු අතර, 2021 දෙසැම්බර් මස වාර්තාව සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළැඹිණි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවෙන් අනුමැතිය ලැබීමෙන් අනතුරුව, මෙම වාර්තාව 2022 වසර තුළ ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

**4. ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් මස ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට අදාළ සමාලෝචන කටයුතු ආරම්භ කරන ලද අතර, මේ සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයන් පත් කරන ලදී.

1. මහාචාර්ය ජේ.එම්.පී.කේ. ජයසිංහ මහතා (සභාපති)
2. මහාචාර්ය උපාලි එස් අමරසිංහ මහතා
3. මහාචාර්ය කේ.එච්.එම්. අශෝක දීපානන්ද මහතා

සමාලෝචන මණ්ඩලය විසින් 2021 මැයි මාසයේදී කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කරන ලද අතර, ආයතනය විසින් 2021 අගෝස්තු මස වාර්තාව සඳහා අදහස් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ කළමනාකාරිත්වය හා සමාලෝචන මණ්ඩලය අතර සාකච්ඡාවන්ගෙන් අනතුරුව, අවසන් වාර්තාව 2021 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී. 2022 වසර තුළ මෙම වාර්තාව අවසන් අනුමැතිය පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත භාරදෙනු ඇත.

**5. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)**

කාර්මික තාක්ෂණායතනයේ සමාලෝචන මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ:

1. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා (සභාපති)
2. මහාචාර්ය ප්‍රියාණි අසෝකා පරණගම මහත්මිය
3. ඩී.ඒ. ශ්‍රියානි සකුන්තලා තෙන්නකෝන් මහත්මිය

ජ්‍යෙෂ්ඨ කළමනාකරිත්වය හා මණ්ඩලය සමග පවත්වන ලද සාකච්ඡාවකින් අනතුරුව සමාලෝචන මණ්ඩලය විසින් 2021 පෙබරවාරි මස කෙටුම්පත් වාර්තාව භාරදෙන ලද අතර, අවසන් වාර්තාව මැයි මාසයේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. වාර්තාවේ කටයුතු අවසන් කරනු පිණිස කොමිෂන් සභා අනු කාරක සභාවක් පිහිටුවන ලදී. අනු කමිටුව විසින් වාර්තාව ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා ලදී.

## 6. රබර් පර්යේෂණ ආයතනය (RRI)

පහත සඳහන් විශේෂඥ මණ්ඩලය විසින් 2020 සැප්තැම්බර් මස 15වන දින රබර් පර්යේෂණ ආයතන සමාලෝචන කටයුතු ආරම්භ කරන ලදී:

1. ආචාර්ය අයි.ජේ. ද සොයිසා මහත්මිය (සභාපති)
2. ආචාර්ය කුමුදිනි ගුණසේකර මහත්මිය
3. ඒ.ඒ.එම්.ටී. අදිකාරි මහතා

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුකොට 2020 වසර තුළ සමාලෝචන පරීක්ෂාවන් සිදු කිරීමට මණ්ඩලයට නොහැකි වූ බැවින්, සමාලෝචන කටයුතු 2021 වසර තුළ සාර්ථකව සම්පූර්ණ කරන ලදී. රබර් පර්යේෂණ ආයතන කාර්ය මණ්ඩලය හමුවී සාකච්ඡාවන් කිහිපයක් සිදු කිරීමට මණ්ඩලයට හැකිවිය.

2021 සැප්තැම්බර් මස මණ්ඩලය විසින් සිය වාර්තාව භාරදෙන ලදී. කරුණුමය සනාථකරණයන් සඳහා අවශ්‍ය අදහස් ලබාගැනීමෙන් හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය හා කළමනාකරණ මණ්ඩලය සමග සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව, 2021 දෙසැම්බර් මස මෙම සමාලෝචන කාර්යය අවසන් කරන ලදී. සමාලෝචන වාර්තාව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2022 වසරේදී අනුමත කිරීමට නියමිතව ඇත.




*රූපය 3 : රබර් පර්යේෂණායතනයේ (RRI) කාර්ය සාධනය*

## 7. පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය (ROP)

පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සමාලෝචන කටයුතු පහත විශේෂඥ මණ්ඩලය විසින් 2021 ජනවාරි මස ආරම්භ කරන ලදී:

1. මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න (සභාපති)
2. ආචාර්ය අයි.ජේ. ද සොයිසා මහත්මිය
3. මහාචාර්ය ප්‍රතිභා අරුනි වීරසිංහ මහත්මිය

පේරාදෙණියේ පිහිටි පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මෙන්ම උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධනායතනයේ එහි පරීක්ෂණාගාරයද මණ්ඩලයේ පරීක්ෂාවට ලක්විය. රැස්වීම් ගණනාවකට පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත ආරාධනා කෙරිණි. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකු සමග විශේෂ රැස්වීමක්ද පවත්වන ලදී. මෙම සමාලෝචන කාර්යය 2022 දෙවන කාර්තුව තුළ අවසන් කිරීමට නියමිතය.



*රූපය 4 : පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ (ROP) කාර්යසාධන සමාලෝචනය*

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): ආයතනවලට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජය දැනුවත් කිරීමට පෙර අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්ගේ අදහස් විමසීම*

**විද්‍යා හා තාක්ෂණ (S&T) සංවර්ධනය උදෙසා වූ ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජය දැනුවත් කිරීම**

- **ප්‍රතිපත්තිමය හිදැස් හා අවශ්‍යතාවයන් හඳුනාගනු පිණිස විද්‍යාඥයන්, ඉංජිනේරුවන් හා පර්යේෂකයන් පෙළ ගැස්වීම**

**01. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය (SSF)**

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය යනු ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් අතර විද්‍යා හා තාක්ෂණ අංශයෙහි සහයෝගිතාව දිරිගන්වමින් හා බලගන්වමින් විද්‍යාඥයන් විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනයට අදාළ ප්‍රතිපත්ති හා සමාලෝචනයන් සැකසීමේ කාර්යයෙහි නියුක්ත කරවීමේ අරමුණ සහිතව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද තවත් එක් උපදේශක සංසදයකි. 2001 වසරේදී ආරම්භ කරන ලද ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය 2010 දක්වා දශකයක කාලයක් සක්‍රියව පැවතිණි. විවිධ අභියෝග හේතුකොට, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය 2011 සිට 2020 දක්වා කාලය තුළ ක්‍රියාත්මක නොවිණි.

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය නැවත සක්‍රීය කරනු පිණිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී 2021 අප්‍රේල් මස 8වන දින මෙම වැඩමුළුව පවත්වන ලදී. ආසන්න වශයෙන් විද්‍යාඥයන් 80 දෙනෙකු පමණ පෞද්ගලිකව මෙන්ම Zoom තාක්ෂණය හරහාද රැස්වීමට සහභාගී වෙමින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය නැවත ක්‍රියාත්මක කරවීම සම්බන්ධ සිය අදහස් දක්වන ලදී. විධිමත් වාර්ෂික මහා සභා රැස්වීමක් හරහා විධායක කමිටුව පත් කිරීමට ඉවහල් වන

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය සඳහා ලේඛන හා ප්‍රඥප්තිය සකස් කිරීම සඳහා 14 දෙනෙකුගෙන් සමන්විත වූ තාවකාලික ක්‍රියාකාරී කණ්ඩායමක් ඔවුන් අතරින් ස්වේච්ඡා පදනම මත තෝරා ගන්නා ලදී. ඒ හා සමාන්තරව සංසදය සඳහා ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු වස් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් තුනක් පවත්වන ලදී. අනුමැතිය පිණිස අදාළ කෙටුම්පත කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. සංසදයේ පළමු විධායක කමිටුව වශයෙන් ක්‍රියාකාරී කණ්ඩායම විධිමත් ලෙස අනුමත කරනු පිණිස 2022 වසර තුළ සංසදයේ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වෙනු ඇත.




*රූපය 5 : ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුවක්*

## 02. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF)

ජාලගතකරණය සඳහා වූ අවකාශයක් නිර්මාණය කරන අතර දැනුම බෙදාහදා ගැනීම උදෙසා වූ වේදිකාවක් ගොඩනඟනු වස් ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන්ට අවස්ථාවක් ලබාදෙනු පිණිස 2000 වසරේ සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයන්ගේ සංසදය වෙත අනුග්‍රාහකත්වය ලබාදෙනු ලබයි. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය මේවන විට විවිධ විෂය ක්ෂේත්‍රයනට අයත් සාමාජිකයන් 400 ඉක්මවූ පිරිසකගෙන් සමන්විත වේ.

### I. <u>*තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ (YSF) විධායක කාරක සභාව*</u>

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සැදි විධායක කාරක සභාවකින් සමන්විත වේ. විධායක කාරක සභාව සම ලේකම්වරුන් දෙදෙනෙකුගෙන් සහ සභාපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. සැම වසරකම වාර්ෂික මහා සභා රැස්වීම තුළ නව විධායක කාරක සභාවක් තෝරාගනු ලබයි. රට තුළ පැවති කොවිඩ් 19 තත්ත්වය හේතුකොට මාර්ගගත රැස්වීමක් ලෙස 2021 මාර්තු මස පළමුවැනි දින පවත්වන ලද වාර්ෂික මහා සභා රැස්වීමේදී 2021 විධායක කාරක සභාව තෝරා පත්කර ගන්නා ලදී.

### II. <u>*තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වාර්ෂික පර්යේෂණ සමුළුව*</u>

2012 වසරේදී ආරම්භ කරන ලද තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පර්යේෂණ සමුළුව ජාලගතකරණය හා තාක්ෂණ - ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවකාශයක් නිර්මාණය කරමින් විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ තොරතුරු හා පර්යේෂණ අභිලාශයන් බෙදාහදා ගනිමින් සිදුකරන සහයෝගී පර්යේෂණ කාර්යයන් ප්‍රවර්ධනයෙහි ලා තරුණ විද්‍යාඥයන් වෙත වේදිකාවක් ලබාදීමේ අරමුණ පෙරදැරිව මේවන විට ජනප්‍රිය සමුළුවක් බවට පත්ව ඇත.


සමුළුවේ 10වන වාර්ෂික සංවත්සරය සමරමින් මාර්ගගත අවස්ථාවක් වශයෙන් 2022 මාර්තු මස 18වන දින සිය 10වන වාර්ෂික පර්යේෂණ සමුළුව පැවැත්වීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත. විස්තෘත සාරාංශ පත්‍රිකා හා සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා යන දෙවර්ගයම භාරගන්නා ලදී. පර්යේෂණ පත්‍රිකා ඉල්ලා සිදුකරන ලද දැනුම් දීමට ප්‍රතිචාර දක්වමින්, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත තරුණ විද්‍යාඥයන්ගේ සංසද සාමාජිකයන් වෙතින් විස්තෘත සාරාංශ පත්‍රිකා 58ක් හා සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකා 22ක් ලැබිණි. ද්වි පාර්ශ්ව ආවරණ සමාලෝචන ක්‍රියාවලියක් තුළ එක් එක් පත්‍රිකාව ජොෂ්ඨ විද්‍යාඥයන් දෙදෙනෙකු විසින් සමාලෝචනය කරන ලදී. 2021 වසර අවසානය වනවිට, සමාලෝචන ක්‍රියාවලිය සිදු වෙමින් පැවති අතර, 2022 මාර්තු මාසය වනවිට ක්‍රියාවලිය අවසන්කොට ඉන්පසු සමුළුව අවසන් කිරීම සංසදයේ අපේක්ෂාව විය.

## III. ***ජාතික ප්‍රමුඛතා සහ රටේ ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණ මාලාව***

තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ 2021 වසර සඳහා වූ කාර්ය සැලැස්මේ කොටසක් ලෙස සංසදය විසින් මාර්ගගත සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. මෙම මාර්ගගත සම්මන්ත්‍රණයන්හි ප්‍රධාන අරමුණ වනුයේ රට තුළ පවත්නා හා නැග එමින් පවත්නා විද්‍යාත්මක කටයුතු සම්බන්ධයෙන් තරුණ විද්‍යාඥයන් අතර දැනුවත්භාවය ඇති කොට දැනුම පතුරුවා හැරීමයි. උක්ත අරමුණ පදනම්ගතව, 2021 වසර තුළ දැනුවත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණ 5ක් සංවිධානය කරන ලදී.

i. **බුද්ධිමය දේපළ නිමැවුම හා ආරක්ෂණය සම්බන්ධ තරුණ විද්‍යාඥ මාර්ගගත සම්මන්ත්‍රණය**


තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පළමු මාර්ගගත සම්මන්ත්‍රණය 2021 අප්‍රේල් මස 22වන දින පවත්වන ලදී. එම මාර්ගගත සම්මන්ත්‍රණය "බුද්ධිමය දේපළ නිමැවුම හා ආරක්ෂණය" ඉලක්ක කරගත්තක් වූ අතර ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ගීතාංජලී රණවක මහත්මිය ආරාධිත කථිකයා හා සම්පත් දායකයා ලෙස මාර්ගගතව සභාව අමතන ලදී. ප්‍රශ්නෝත්තර සැසියෙන් අනතුරුව මාර්ගගත සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් විය.




*රූපය 6 : බුද්ධිමය දේපළ නිමැවුම හා ආරක්ෂණය සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

ii. **සමුද්‍ර ප්ලාස්ටික් දූෂණය හා ජලජ ජීවීන් කෙරෙහි ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගතවීමේ බලපෑම් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය**


තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ දෙවන මාර්ගගත සම්මන්ත්‍රණය 2021 ජුලි මස 21වන දින පවත්වන ලදී. මෙම මාර්ගගත සම්මන්ත්‍රණය 'සමුද්‍ර ප්ලාස්ටික් දූෂණය හා ජලජ ජීවීන් කෙරෙහි ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වීමේ බලපෑම්' යන ක්ෂේත්‍රය කෙරෙහි යොමු වූවක් වූ අතර, කැලණිය විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයනාංශයේ සත්ත්ව විද්‍යා හා පරිසර කළමනාකරණ මහාචාර්ය යූ.පී.කේ. ඈපා මහතා විසින් ආරාධිත කථිකයා හා සම්පත් දායකයා ලෙස මාර්ගගත සභාව අමතන ලදී. 65 දෙනෙකු පමණ සහභාගී වූ මෙම මාර්ගගත සම්මන්ත්‍රණය ප්‍රශ්නෝත්තර සැසියෙන් අනතුරුව සාර්ථකව අවසන් විය.




*රූපය 7 : සාමුද්‍රික ප්ලාස්ටික් දූෂණය හා ජලජ ජීවීන් කෙරෙහි ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත වීමේ බලපෑම් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

**iii. කොවිඩ්-19 එන්නත් හා ප්‍රභේද (අපට සාමූහික ආරක්ෂාවක් ලැබෙනුයේ කවදාද?) සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය**


'කොවිඩ්-19 එන්නත් හා ප්‍රභේද අපට සාමූහික ආරක්ෂාවක් ලැබෙනුයේ කවදාද? යන තේමාව යටතේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් 2020 අගෝස්තු මස 10වන දින සිය තෙවන මාර්ගගත සම්මන්ත්‍රණය පවත්වන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිකරණ හා අනුක වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානී මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය විසින් මාර්ගගත සභාව අමතන ලදී. පුද්ගලයන් 85 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් යුතුව මෙම සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් කරන ලදී.




*රූපය 8 : කොවිඩ් 19 එන්නත් හා ප්‍රභේද සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

**iv. ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපාදන ලබාගන්නා ආකාරය පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය**

2021 නොවැම්බර් මස 24වන දින තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ සිව්වන මාර්ගගත සම්මන්ත්‍රණය පවත්වන ලදී. එම මාර්ගගත සම්මන්ත්‍රණය තුළ 'ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපාදන ලබාගන්නා ආකාරය' පිළිබඳ අවධානය යොමු කරන ලද අතර ආරාධිත කථික හා සම්පත් දායකවරයා වශයෙන් ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර සම්බන්ධතා අංශ ප්‍රධානී ජේ.ජී. ශාන්ත සිරි මහතා විසින් මාර්ගගත සභාව අමතන ලදී. සහභාගිකරුවන් 90 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම මාර්ගගත සම්මන්ත්‍රණය ප්‍රශ්නෝත්තර සැසියකින් පසුව සාර්ථකව අවසන් විය.




*රූපය 9 : ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපාදන ලබාගන්නා ආකාරය සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

### v. දකුණු ආසියාවේ න්‍යෂ්ටික සංකීර්ණතාවයන් පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය

විද්‍යාඥයන්ගේ තරුණ විද්‍යාඥ සංසදයේ 5වන මාර්ගගත සම්මන්ත්‍රණය 2021 දෙසැම්බර් මස 09වන දින පවත්වන ලදී. 'දකුණු ආසියාවේ න්‍යෂ්ටික සංකීර්ණතාවයන් :න්‍යෂ්ටික සෙවණැල්ල යටතේ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධව අවධානයට ලක්විය යුතු කරුණු' සම්බන්ධයෙන් මෙම මාර්ගගත සම්මන්ත්‍රණය තුළ අවධානයට ලක් කරන ලද අතර, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ ක්‍රමෝපාය අධ්‍යයනය පිළිබඳ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සනත් ද සිල්වා මහතා විසින් ආරාධිත කථිකයා හා සම්පත් දායකයා වශයෙන් මාර්ගගත සභාව අමතන ලදී. සහභාගිකරුවන් 50 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් පැවැත්වූ මෙම මාර්ගගත සම්මන්ත්‍රණය ප්‍රශ්නෝත්තර සැසියකින් පසුව සාර්ථකව අවසන් විය.




*රූපය 10 : දකුණු ආසියාවේ න්‍යෂ්ටික සංකීර්ණතාවයන් පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

## IV. ජාතික ප්‍රමුඛතා හා රට තුළ පවත්නා ගැටලු සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ ප්‍රකාශන මාලාව

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් 2021 වසර තුළ එහි ප්‍රධාන කටයුතු අතරින් එකක් වශයෙන් පරිච්ඡේදගත විද්‍යුත් පොතක් පළ කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී. මෙම විද්‍යුත් පොතෙහි ප්‍රධාන අරමුණ වනුයේ හඳුනාගනු ලැබූ මාතෘකාවක් සම්බන්ධයෙන් පවත්නා තොරතුරු පිළිබඳ විස්තීර්ණ සමාලෝචනයක් ලබා දෙමින් ප්‍රතිපත්තිමය හිඩැස් හඳුනා ගැනීමයි. තරුණ විද්‍යාඥයන් හට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියෙහි කොටස්කරුවන් බවට පත් වීමේ අවකාශයක් නිර්මාණය කරමින් ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය තුළට විද්‍යාත්මක පැතිකඩයන් අන්තර්ගත කරනු පිණිස සමාලෝචනය මත පදනම්ව, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම/ මැදිහත්කරණයන් හා නව ප්‍රතිපත්ති ක්ෂේත්‍ර සඳහා වන නිර්දේශ මෙමගින් ඉස්මතු කර පෙන්වා දෙනු ඇත..

විද්‍යුත් පොතෙහි මාතෘකාව "පරිසර තිරසාරත්වය හා ආහාර සුරක්ෂිතතාවය: ශ්‍රී ලංකාව උදෙසා වඩා විචිත්‍රවත් ප්‍රතිපත්තිමය මූලාරම්භයන්ගේ අවශ්‍යතාවය" වන අතර, උක්ත තේමාව යටතේ විවිධ මාතෘකා සම්බන්ධ පොත් පරිච්ඡේද 20ක් තරුණ විද්‍යාඥයන්ගේ සංසද සාමාජිකයන් වෙතින් ලැබී ඇති අතර පුළුල් සමාලෝචන ක්‍රියාවලියකින් අනතුරුව පරිච්ඡේද විද්‍යුත් පොතක් තුළට සම්පාදනය කෙරෙනු ඇත. 2022 මාර්තු මස පැවැත්වීමට නියමිත තරුණ විද්‍යාඥයන්ගේ 10වන සමුළුවේදී විද්‍යුත් පොත එළි දැක්වෙනු ඇත.

ඊළඟ වසර වනවිට පුවත්පත්හි පළ කරනු පිණිස තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් රටතුළ පවත්නා ජාතික ප්‍රමුඛතාවයන් හා විද්‍යා හා තාක්ෂණවේදය ආශ්‍රිත ගැටලු පෙන්වා දෙන්නා වූ පුවත්පත් ලිපිද එහි සාමාජිකයන් වෙතින් ඉල්ලා සිටින ලදී.

## V. තරුණ විද්‍යාඥ සම්මානය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සෑම වසරකම තරුණ විද්‍යාඥයන්ගේ සංසදයෙන් තෝරාගත් කැපී පෙනෙන තරුණ විද්‍යාඥයෙකු වෙත තරුණ විද්‍යාඥ ගෞරව සම්මානය පිරිනමනු ලබයි. කොමිෂන් සභාව විසින් පත් කරන ලද අනු කාරක සභාවේ තීරණ ප්‍රකාර, කාණ්ඩ දෙකක් යටතේ තරුණ විද්‍යාඥ සම්මානය පිරිනැමීමට තීරණය කරන ලදී: "පර්යේෂණ සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය" හා ඉල්ලුමට අනුව සිදු කෙරෙන පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අභිලාෂය සහිතව 2021 වසරේ සිට "තාක්ෂණය සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය" වශයෙනි. මේ ක්‍රියාවලිය සඳහා, සම්මාන දෙක සඳහා වූ ලකුණු දීමේ පරිපාටීන් තෝරා ගැනීමේ නිර්ණායක සංශෝධනය කොට අවසන් කිරීමෙන් අනතුරුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සම්මාන සඳහා ඉල්ලුම් කරනු පිණිස ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන් වෙතින් අයදුම්පත් කැඳවන ලදී. 2021 වසර සඳහා ලද මුළු අයදුම්පත් ගණන 41ක් වන අතර, සුදුසුකම් අනුව ඒ අතරින් අදියර යටතේ වඩා සුදුසු අය තෝරා ගැනෙනු ඇති අතර කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන විශේෂඥ මණ්ඩලයක් විසින් සිදුකරන ශ්‍රේණිගත කිරීමක් පදනම් කරගනිමින් එක් එක් කාණ්ඩයෙන් එක් සම්මානලාභියෙකු බැගින් තෝරා ගැනෙනු ඇත. 2022 මාර්තු මස පැවැත්වීමට නියමිත ඊළඟ තරුණ විද්‍යාඥයන්ගේ සංසද සමුළුවේදී තරුණ විද්‍යාඥ සම්මාන දෙක පිරිනැමෙනු ඇත.

# ජාත්‍යන්තර කටයුතු

## *නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre)*

1989 වසරේ සිට ඉන්දියාවේ ස්ථානගතව පවත්නා අන්තර් රාජ්‍ය සංවිධානයක් වන නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre, www.namstct.org) විද්‍යා හා තාක්ෂණය සම්බන්ධ දකුණු-දකුණු සහයෝගිතාව ප්‍රවර්ධනයෙහි ලා බොහෝ සෙයින් සක්‍රීය ආයතනයකි. ශ්‍රී ලංකාව වූකලී ලතින් ඇමරිකා, අප්‍රිකා, ආසියානු හා යුරෝපානු මහාද්වීපයන් පුරා විහිදි මෙම මධ්‍යස්ථානයේ ගෞරවාන්විත සාමාජික රටවල් 47 අතරින් එකකි. එමගින් සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සමගින් නොබැඳි විද්‍යාඥයන්, තාක්ෂණඥයන් හා විද්‍යාත්මක සංවිධාන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සැලසෙන්නාවූ සහයෝගිතාවය ලබාගැනීමේ වරප්‍රසාදය ලබාදෙනු ලබයි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකාව සඳහා වූ නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ කේන්ද්‍රස්ථානය වශයෙන් කටයුතු කරයි.

මේ දක්වා නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාව තුළද එවන් ජාත්‍යන්තර පාඨමාලාවන් හතක්ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ මාතෘකා ගණනාවක් යටතේ විවිධ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාත්‍යන්තර වැඩමුළු 84ක් පමණ හා පුහුණු පාඨමාලා 40ක් පමණ සංවිධානය කර ඇත. ශ්‍රී ලංකාවේ බොහෝ පිරිසක්ද ඇතුළත්ව ලොව පුරා සිටින්නා වූ විශාල පර්යේෂකයන් හා වෘත්තිකයන් සංඛ්‍යාවක් වෙත මෙම පාඨමාලාවන් වෙතින් ප්‍රතිලාභ සැලසී ඇත. 2004, 2010 හා 2018 වශයෙන් මින් පෙර තෙවරක් නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ පාලක සභාවන්හි කාර්යාංශ රැස්වීම්වල සත්කාරකත්වය ශ්‍රී ලංකාව විසින් දරා ඇත. නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා රැස්වීම ශ්‍රී ලංකාවේ කොළඹදී 2020 සැප්තැම්බරයේ පැවැත්වීමට නියමිතව පැවතියද, කොවිඩ් 19 වසංගතය හේතුකොටගෙන බහුතර රටවල් සංඛ්‍යාවක පැවති තත්ත්වය සැලකිල්ලට ගනිමින් hybrid වැඩසටහනක් ලෙස 2021 පෙබරවාරි මස 24වන දිනට එය පවත්වන ලදී.

### I. නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා රැස්වීම

2021 පෙබරවාරි මස 24වන දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන සභා රැස්වීම ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අනුග්‍රහයෙන්, ශ්‍රී ලංකාවේ තාක්ෂණ අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. මාල දිවයින, ඕමානය, රුමේනියාව හා තුර්කිය යන රටවල් හතරේ තානාපති කාර්යාල නියෝජිතයන්ද ඇතුළත් රටවල් 24ක නියෝජිතයන් අනූ හය දෙනෙක්ද; ශ්‍රී ලංකාවේ විවිධ අමාත්‍යාංශ හා විද්‍යා නියෝජිතායතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද; නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථාන ලේකම් කාර්යාලයේ නියෝජිතයෝද රැස්වීමට සහභාගි වූහ. එයට සහභාගි වූ ශ්‍රී ලාංකික නියෝජිතවරුන් හා Zoom රැස්වීම් වේදිකාව හරහා සම්බන්ධ වූ ජාත්‍යන්තර නියෝජිතයන්ද ඇතුළත් 20 දෙනෙකුගෙන් පමණ වූ පිරිසකගේද සහභාගිත්වයෙන් කොළඹ මිලෝදා මූල්‍ය අධ්‍යයනායතනයේදී ක්‍රියාකාරී කමිටු රැස්වීමේ සමාරම්භක උත්සවය පැවැත්විණි.

සමාරම්භක උත්සවයේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා සාමාජික මහාචාර්ය රොහාන් මුණසිංහ විසින් නියෝජිතවරුන් සාදරයෙන් පිළිගන්නා ලද අතර, ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි

වූ අතිගරු ජනාධිපති හා ගරු තාක්ෂණ අමාත්‍ය ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් වීඩියෝ පණිවිඩ ක්‍රමය හරහා රැස්වූ පිරිස ආමන්ත්‍රණය කරන ලදී. ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාවයක් සහිත සියලු අංශයන්හි නව තාක්ෂණයන් හඳුන්වා දෙනු සඳහාම තාක්ෂණ අමාත්‍යාංශයක් ශ්‍රී ලංකාව විසින් ස්ථාපනය කරනු ලැබ ඇති බව අතිගරු ජනාධිපතිතුමා විසින් අවධාරණය කරන ලදී. නොබැඳි ජාතින්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයට සාමාජික රටවල පවත්නා පොදු අභිලාශයන් හඳුනා ගනිමින් සියලු දෙනා හට ප්‍රතිලාභ සැලසෙන සාමූහික යාන්ත්‍රණයක් ගොඩ නැංවීමේදී වඩා විශාල කාර්යභාරයක් ඉටුකල හැකි බවට අතිගරු ජනාධිපතිතුමා විසින් යෝජනා කරන ලදී. කාලගුණික විපර්යාස ක්ෂේත්‍රය විශේෂ කොටගෙන මෙම වසංගත තත්ත්වය තුළ අපගේ තිරසර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීමෙහි ලා අපට කෙතරම් යහපත් සහයෝගිතාවයක් පවත්වාගත හැක්කේද යන කරුණ සලකා බැලීමේ සිය කැමැත්තද අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ක්‍රියාකාරී කමිටු රැස්වීමේදී ශ්‍රී ලංකාවේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතා 5වන පාලක සභාවේ සභාපතිවරයා වශයෙන් තෝරා පත්කර ගන්නා ලදී.




*රූපය 11 : නොබැඳි ජාතින්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා රැස්වීම*

## II. 15වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම

නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම ඊජිප්තු අරාබි ජනරජ ආණ්ඩුවේ විද්‍යාත්මක පර්යේෂණ හා තාක්ෂණ විද්‍යායතනයේ අනුග්‍රහයෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ 2021 සැප්තැම්බර් මස 20වන දින පවත්වන ලදී. ශ්‍රී ලංකාව වෙනුවෙන් නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ කේන්ද්‍රස්ථානය වශයෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවද ඇතුළත්ව, සාමාජික රටවල නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථාන කේන්ද්‍රස්ථාන ඇතුළත් රටවල් 20ක නියෝජිතවරුන් 43 දෙනෙක් මෙම රැස්වීමට සහභාගි වූහ. ශ්‍රී ලංකා රජයේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතා හා නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභා සභාපති වශයෙන් ආරම්භක හා ක්‍රියාකාරී මට්ටමේ රැස්වීමෙහි මුලසුන දරන ලදී.

නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මධ්‍යස්ථානයේ සාමාජික රටවල් විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු හා සෙසු කෙටි හා දිගු කාලීන පුහුණු වැඩසටහන්වලට සහභාගි වීම සඳහා විද්‍යාඥයන් හා සෙසු නිලධාරීන් වෙත අවස්ථාවන් සම්පාදනය කරනු ලබයි. පවත්නා කොවිඩ් තත්ත්වය හේතුකොට, නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් 2021 වසර තුළ සංවිධානය කරන ලද වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද අතර, පහත සඳහන් ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හට නොබැදි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ රැස්වීම්වලට සහභාගි වීමේ අවස්ථාව උදාවිය:




*රූපය 12 : 15වන පාලක සභාවේ පළමු කාර්යාංශ රැස්වීම*

**2021 මාර්තු මස 31 දින සිට අප්‍රේල් මස පළමුවැනි දින දක්වා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද "සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා වූ සුහුරු කෘෂිකර්මය: පුළුල් දෘෂ්ටි කෝණයන් හා දූපත් රාජ්‍යයන් සඳහා වූ විශේෂ අභියෝග" පිළිබඳ වූ ජාත්‍යන්තර වැඩමුළුව**

1. ආචාර්ය උවසරා දිසානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකර්ම ව්‍යාප්ති අධ්‍යයනාංශය කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2. ආචාර්ය කන්දයියා පකීරාදන්, අංශාධිපති හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකාර්මික ජීව විද්‍යා අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය.
3. ආචාර්ය ජී.වී.ටී.වී. වීරසූරිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකර්ම ඉංජිනේරු හා පාංශු විද්‍යා අධ්‍යයනාංශය, කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ 2021 මැයි මස 11-12 දිනවල පවත්වන ලද "ඉහළ බිම් දීප්ත සනත්වයක් සහිත රටවල අකුණු අනතුරු අවම කිරීමේ උපාය මාර්ගවල ප්‍රතිපත්ති සංවර්ධනය" පිළිබඳ ජාත්‍යන්තර වටමේස සාකච්ඡාව**

1. අනෝජා සෙනෙවිරත්න මහත්මිය, අධ්‍යක්ෂ (සමන පර්යේෂණ හා සංවර්ධන), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
2. ඉංජි. ඩී.ටී. රූපසිංහ, නියෝජ්‍ය අධ්‍යක්ෂ - අධීක්ෂණ හා ඇගයුම්, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**2021 ජූලි මස 26-27 දිනවල මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද "බලශක්ති ආරක්ෂාව හා බලශක්ති ප්‍රවේශය: සංවර්ධනය වෙමින් පවත්නා රටවල දුර්වල බලශක්ති ගුණත්වයේ සෞඛ්‍යමය ගැටලු" නමින් යුත් ජාත්‍යන්තර වැඩමුළුව**

1. ආචාර්ය ටී.එම්.එම්. මාර්සෝ, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ, ඛනිජතෙල් හා ලිහිසි ද්‍රව්‍ය පරීක්ෂණාගාරය, කාර්මික තාක්ෂණ ආයතනය.

**2021 දෙසැම්බර් මස 7-8 දිනයන්හි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ "තාක්ෂණ හුවමාරුව හා වාණිජකරණය" යන මැයෙන් පවත්වන ලද නොබැඳි ජාතීන්ගේ රාජ්‍යයන්හි ජාත්‍යන්තර වැඩමුළුව**

1. ආචාර්ය කේ.ජී.අනෝජා අත්තනායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා අංශ ප්‍රධානී, ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය
2. ආචාර්ය එ.කේ. රණවීර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය, කැළණිය විශ්වවිද්‍යාලය
3. ආචාර්ය ප්‍රදීප් ඩබ්. සමරසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා කවුළුව, පරිගණක හා තාක්ෂණ පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය
4. පී.සී. අබේසිරිවර්ධන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

## මානව සම්පත් කළමනාකරණය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ උපදෙස් සපයන ප්‍රධානතම ආයතනය වශයෙන් පිහිටුවනු ලැබ ඇත.

උක්ත කාර්යය ඉටු කරනු පිණිස, ආයතනික අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව රට තුළ විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය උදෙසා වූ ප්‍රයත්නයක නිරතව සිටී.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහයට අනුව සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් සහ විද්‍යාඥයන්, විශේෂඥ අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශන සංසද සමඟ සම්බන්ධ වී කොමිෂන් සභාවේ අනෙකුත් සියලුම විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයමින් ඒවා සම්බන්ධීකරණය හා කළමනාකරණය කරනු ලබයි. ආයතනයේ සියළුම මූල්‍ය හා පරිපාලන කළමනාකරණයට අදාළ කටයුතු නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ (මුදල් හා පරිපාලන) අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. සහායක කාර්ය මණ්ඩලය; පරිපාලන නිලධාරී, වැඩසටහන් සහායකයින් දෙදෙනෙකු (වැඩසටහන් සහකාර-මූල්‍ය හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ/ දත්ත ගබඩා සහකාර), කළමනාකරණ සහකාරවරුන් පස් දෙනෙකු, කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු සහ රියදුරන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කොමිසම් සභාවට අවශ්‍ය පරිදි විශේෂිත කාර්යයන් හා පැවරුම් ඉටු කිරීම සඳහා, අවශ්‍යතා මත පදනම්ව උපදේශකයින් සහ පර්යේෂණ සහායකයින් ගෙවීමේ පදනම මත ලබා ගනු ලැබේ.

**2021.12.31 දිනට කාර්ය මණ්ඩල සංයුතිය පිළිබඳ තොරතුරු සාරාංශය**

| කාර්ය මණ්ඩල කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරු (HM 2-3) | 01 | 01 |
| අධ්‍යයන හා පර්යේෂණ නිලධාරීන් (AR-2, AR-1) | 04 | 03 |
| මධ්‍යම මට්ටමේ කළමනාකරු (MM 1-1) | 01 | 01 |
| කණිෂ්ඨ මට්ටමේ කළමනාකරු (JM 1-2) | 01 | 01 |
| ආශ්‍රිත නිලධාරීන් (MA – 3) | 02* | 02 |
| කළමනාකරණ සහකාර (MA- 1-2) | 05 | 01 |
| ප්‍රාථමික මට්ටම (PL 3 සහ PL 1) | 05 | 04 |

02* වැඩසටහන් සහකාර - මුදල් තනතුර එම තනතුර දරන්නාට පෞද්ගලික වේ

## කාර්ය මණ්ඩල පුවත්


- ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිඩ් ෂහමි මහතා හට වරලත් සංඛ්‍යාන නිලධාරියෙකු වශයෙන් රාජකීය සංඛ්‍යාන සංගමය මගින් වරලත් තත්ත්වය පිරිනමන ලදී. වරලත් සංඛ්‍යාන නිලධාරී යනු රාජකීය සංඛ්‍යාන සංගමයේ ඉහළම වෘත්තීය සුදුසුකම වේ. එමගින් සාමාජිකයෙකුගේ සංඛ්‍යාන සුදුසුකම, ඉහළ මට්ටමේ සංඛ්‍යාන සම්බන්ධ වෘත්තීය පරිචය, තාක්ෂණික තත්ත්වය හා සිය වෘත්තීය ජීවිතය පුරා සංඛ්‍යාන න්‍යාය හා පරිචය ආශ්‍රිතව ඉදිරි පෙළ ක්‍රියාකාරිකයෙකු ලෙස වැජඹීම සඳහා වූ කැපවීම පිළිබඳ විධිමත් පිළිගැනීමක් ලබාදෙනු ලබයි.

- ඉහළ සුවිගතකරණයක් සහිත සම මට්ටමේ වෘත්තිකයන් විසින් සමාලෝචිත වෛද්‍ය සඟරාවක් තුළ පළ කරන ලද "ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ ප්‍රාථමික රෝහල්වල ආත්‍රපෝඩාවන් දෂ්ට කිරීම් සහ සපාකෑම් පිළිබඳ සායනික-වසංගතවේදය" (Clinico-epidemiology of arthropod stings and bites in primary hospitals of the North-Western province of Sri Lanka) නමින් යුත් ඔහුගේ එක් සාමූහික සෞඛ්‍ය ප්‍රතිපත්ති කෘතියක් සඳහා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිඩ් ෂහමි මහතා ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ 2021 කුසලතා සම්මානයෙන් පුදන ලදී.

- 2021 දෙසැම්බර් මස 21වන දින නිශාන්ති මහරගේ මහත්මිය සිය කළමනාකරණ සහකාර ධුරයෙන් ඉල්ලා අස් වූවාය.


## ධාරිතා වර්ධනය / ගෘහස්ථ හා බාහිර පුහුණු වැඩසටහන්

- 2021 අගෝස්තු මස 30වන දින සිට 2021 සැප්තැම්බර් මස 4වන දින දක්වා මැලේසියාවේ - දකුණු සහයෝගිතාවය සඳහා වූ ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානය අනුග්‍රහයෙන් "සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා වූ විද්‍යා, තාක්ෂණ, හා නවෝත්පාදන ප්‍රතිපත්තිය" පිළිබඳ වූ මාර්ගගත ජාත්‍යන්තර පුහුණු වැඩසටහනට විද්‍යාඥවරියක වන තිළිණි මූණගමගේ මහත්මිය සහභාගි වූවාය.



*රූපය 13 : "සමාජාර්ථික සංවර්ධනය උදෙසා වූ විද්‍යා, තාක්ෂණ, හා නවෝත්පාදන ප්‍රතිපත්තිය" පිළිබඳ වූ මාර්ගගත ජාත්‍යන්තර පුහුණු වැඩසටහන*

- 2021 අගෝස්තු මස 31වන දින මූල්‍ය අධ්‍යයනයන් පිළිබඳ මිලෝදා අධ්‍යයන ආයතනය විසින් මෙහෙයවන ලද "විවිධත්වයෙන් යුත් පුද්ගලයන් කළමනාකරණය සඳහා මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීම" පිළිබඳ වූ මාර්ගගත සම්මන්ත්‍රණයකට පරිපාලන නිලධාරිනී ලක්මිණි උඩුගම මහත්මිය සහභාගි වූවාය.




*රූපය 14 : "විවිධත්වයෙන් යුත් පුද්ගලයන් කළමනාකරණය සඳහා මෘදු කුසලතාවයන් වැඩිදියුණු කිරීම" පිළිබඳ වූ මාර්ගගත සම්මන්ත්‍රණය*

## සුභසාධන කටයුතු

2021 වසර තුළ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සුභසාධක සංගමය විසින් සිදුකරන ලද වැඩසටහන් හා කාර්යයන් පහත පරිදි වේ.

### නිත්‍ය කටයුතු

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් සෑම නිලධාරියෙකු වෙත රු. 25,000ක අඩු පොළී ණය මුදලක් ලබාදෙන ලදී.

## විදේශ පුහුණු/ වැඩමුළු/ සමුළු/ සම්මන්ත්‍රණ සඳහා සහභාගිත්වය

2021 අගෝස්තු මස 30වන දින සිට 2021 සැප්තැම්බර් මස 02වන දින දක්වා මාර්ගගතව පැවති රජයන් වෙත විද්‍යා උපදෙස් ලබාදීම පිළිබඳ සිව්වන සමුළුවේ "විද්‍යා උපදෙස් නවෝත්පාදනය" නමැති චිත්‍රාගාර සැසියේදී ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිඩ් ෂහමි මහතා විසින් " ප්‍රතිපත්ති සඳහා දත්ත මත පදනම් වූ විද්‍යාව සඳහා වූ නව මං පෙතක්– ශක්තිමත් විද්‍යාත්මක සාක්ෂි ජනනය කිරීමට යෝජිත පද්ධතියක්" (New Horizon for data-driven Science for Policy – A proposed system to generate robust scientific evidence) නමින් වූ ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. මෙම සමුළුව පැවැත්වීම සඳහා රාජ්‍ය විද්‍යා උපදෙස් සඳහා වූ ජාත්‍යන්තර ජාලය, Quebec ප්‍රධාන විද්‍යාඥ කාර්යාලය හා කැනඩා රජය විසින් ඒකාබද්ධව සහාය දක්වන ලදී.

## මූල්‍ය ප්‍රකාශන

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
2021 දෙසැම්බර් මස 31වන දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 1 ,023,097 | 2,203,844 |
| ඉන්වෙන්ට්‍රි / තොග | 2 | 96,453 | 81,905 |
| පෙර ගෙවීම් | 3 | 7,551 | 19,009 |
| සේවක ණය කෙටි කාලීන | 4 | 243,833 | 223,195 |
| | | **1,370,934** | **2,527,953** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 5 | 1,642,696 | 1,690,478 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | 6 | 75,500 | 75,500 |
| සේවක ණය දිගු කාලීන | 7 | 484,500 | 264,948 |
| | | **2,202,696** | **2,030,926** |
| **මුළු වත්කම්** | | | |
| | | **3,573,630** | **4,558,879** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 8 | 9,862,883 | 7,330,862 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් | 9 | 758,012 | 783,915 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | 10 | 4,244,226 | 4,002,944 |
| | | 5,002,238 | 4,786,859 |
| **මුළු වගකීම්** | | **14,865,121** | **12,117,721** |
| | | | |
| **මුළු ශුද්ධ වත්කම්** | | **(11,291,491)** | **(7,558,842)** |
| | | | |
| **ශුද්ධ වත්කම් / හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල | | 1,907,459 | 1,907,071 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 3,741,947 | 3,763,824 |
| සංචිත | | (16,940,897) | (13,229,737) |
| | | | |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | | **(11,291,491)** | **(7,558,842)** |

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද සටහන් පිටු අංක 07 සිට 11දක්වා ද ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් වගකිව යුතු වේ. මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර පහත අත්සන් තබා ඇත.

1. කොමිෂන් සභා සාමාජික        වැඩබලන අධ්‍යක්ෂ        නියෝජ්‍ය අධ්‍යක්ෂ
   මුදල් හා පාලන
2. කොමිෂන් සභා සාමාජික

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
2021 දෙසැම්බර් මස 31වන දිනට
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රතිපාදන | | 19,029,100 | 25,264,065 |
| මූලධන ප්‍රදාන - පර්යේෂණ හා සංවර්ධන | | 1,619,000 | 1,096,000 |
| මූලධන ප්‍රදාන - ධාරිතා ප්‍රවර්ධන | | - | - |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂයවීම් | | 551,393 | 3,056,029 |
| ආදායම | 11 | 30,728 | 101,358 |
| | | **21,230,221** | **29,517,452** |
| | | | |
| **වියදම්** | | | |
| පුද්ගලික පඩිනඩි | 12 | 10,120,018 | 13,361,306 |
| ගමන් වියදම් | 13 | 2,734 | 15,531 |
| සැපයුම් හා පරිහරණය කළ පරිභෝජ්‍ය ද්‍රව්‍ය | 14 | 297,765 | 320,496 |
| නඩත්තු | 15 | 656,690 | 677,742 |
| ගිවිසුම්ගත සේවා | 16 | 7,412,177 | 6,663,219 |
| මාරු කිරීම් | 17 | 4,486,086 | 4,443,935 |
| ධාරිතා වර්ධනය | 18 | 1,333,158 | 2,948,607 |
| රැස්වීම් වියදම් | 19 | 81,360 | 997,519 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 5 | 551,393 | 3,056,029 |
| සමස්ත වියදම් | | **24,941,381** | **32,484,384** |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය /(හිගය) | | **(3,711,160)** | **(2,966,932)** |
| මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය /(අතිරික්තය) | | | |
| | | | |
| | | | |
| **මූල්‍යපිරිවැය** | | | |
| දේපළ පිරියත හා උපකරණ අලෙවියෙන් ලද ලාභය | | | (341,104) |
| කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ අතිරික්තය (ඌනතාවය) | | **(3,711,160)** | **(3,308,036)** |
| | | | |

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/D/NASTEC/1/21/ 65
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 අගෝස්තු 15 දින

සභාපති
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

කොමිෂන් සභාවේ පිරිවැය රු. මිලියන 20.4 ක් වූ දේපළ, පිරියත හා උපකරණවලින්, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු දැනටමත් භාවිතා කරමින් පවතින පිරිවැය රු. මිලියන

පිටුව 1 | 7

63

16.7 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා

දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින්

ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශයේ 6.6 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත ගිණුම් වාර්තා විගණය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කර තිබුණේ මාස 03 දින 15 ක් ප්‍රමාද වී එනම් 2022 ජුනි 15 දීය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති හා අංක PED 12 දරණ පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසාන වී දින 150 කට පසුව කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2019 |

59

හා 2020 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

| | |
|---|---|
| (ඈ) 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය | රාජ්‍ය ව්‍යවසායන්හි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් සඳහා තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකි බව දක්වා ඇතත්, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා විසින් 2011 ජූනි 08 දින තීරු බදු රහිත වාහන බලපත්‍රයක් මත වාහනයක් ආනයනය කර තිබුණි. කෙසේ වුවද, ඔහුගේ පත්වීම් දිනය 2003 ජූලි 31 වූ අතර, තීරු බදු රහිත වාහනය ආනයනය කරන දිනට ඔහුගේ සේවා කාලය වසර 8 ක් පමණක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකරන අතර ඒ සඳහා රු. 1,568,485 ක් වියදම් දරා තිබුණත් එම පරීක්ෂණ කටයුතු අවසන් කර විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ රජයට වූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට හෝ කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 1994 අංක 11 දරණ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව ඉකුත් වර්ෂයෙහි ශ්‍රී ලංකාව තුළ කරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්තාවක් වාර්ෂිකව ආණ්ඩුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018, 2019 හා 2020 වර්ෂයට අදාළ වාර්තාවන් 2021 දෙසැම්බර් විගණන දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 1994 අංක 11 දරණ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ඇ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ අරමුණුවලට අදාලව විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවත් මේ වන විට විද්‍යා හා තාක්ෂණ ආයතන යටතට

ගැනෙන ආයතන 66 ක් හඳුනාගෙන ඇති අතර 2021 දෙසැම්බර් වන විට වසර දහයක් ඇතුලත (2010 - 2020 කාලය තුළ) සමාලෝචනය සිදුකර වාර්තා ඉදිරිපත් කර තිබුණේ ආයතන 22 ක් සඳහා පමණි. ඇගයීම් ක්‍රියාවලිය හා සම්බන්ධ මාර්ගෝපදේශය අනුව මෙම වාර්තාවල ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අදාළව ගත් ක්‍රියාමාර්ග පිළිබඳව වගකීම අදාළ ආයතනයට හා කොමිසමට පැවරී ඇති අතර එම නිර්දේශ ක්‍රියාත්මක වූයේද, පිළිගත්තේද එයින් ප්‍රතිලාභ අත්වූයේද යන්න සොයා බලා වාර්තා සකස් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) 1994 අංක 11 දරණ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ඉ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සම්මේලනය වසර දෙකකට වරක් කැඳවීම, පනතේ 2 වගන්තියේ දක්වා ඇති අරමුණුවලට අදාළව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව සාකච්ඡා කිරීම හා ඒ සාකච්ඡා පිළිබඳ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වුවත් 2016 න් පසු සම්මේලනයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඡ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

(අ) කොමිෂන් සභාවේ තනතුරු 06 ක් පුරප්පාඩු වී පැවතුණි. පුරප්පාඩුව පවතින තනතුරු හයෙන් 05 ක්ම මාස 09 ත් අවුරුදු 03 ත් අතර කාලයක සිට පුරප්පාඩු වී පවතින බව නිරීක්ෂණය වූ අතර එම පුරප්පාඩු තනතුරු සඳහා 2022 ජූනි විගණන දිනය වන විටත් බඳවා ගැනීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව සතු කාර්යන් හා පනතේ අරමුණු කරා ළඟාවීම සඳහා ඉකුත් වර්ෂයන්හිදී කොමිෂන් සභාව විසින් 2018 - 2021 කාලය තුල සකස් කර ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති 05 ක් හා සමාලෝචන වාර්තා 06 ක් 2021 වර්ෂය අවසන් වන විටත් කෙටුම්පත් තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වූ අතර එම වාර්තා අවසන් වාර්තා ලෙස සකස් කර අදාල ආයතනවලට යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව - පිළිතුරු**

---

2.2.2

(අ) කොමිෂන් සභාවේ 2021 වර්ෂයේ ගිණුම් වාර්තා කලින් වර්ෂවල සිදු කල ආකාරයට පෙබරවාරි 28 දිනට පෙර ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමේ අරමුණින් 2022 ජනවාරි මස වන විට පිළියෙල කර, 2022 පෙබරවාරි 22 දින පැවති විගණන සහ කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලදී. එම කමිටුවේ සාමාජිකත්වය දරණ කොමිෂන් සභා සාමාජිකයන් දෙදෙනා අතරින් එක් සාමාජිකයකු කොමිෂන් සභා සාමාජික ධුරයෙන් 2022 පෙබරවාරි මාසයේ ඉල්ලා අස්වූ බැවින් හා කොමිෂන් සභාවේ ඒ වන විට සාමාජිකත්වය දරණ සාමාජිකයන් දෙදෙනා අතරින් එක් කොමිෂන් සභා සාමාජිකයකු විදෙස්ගතව සිටි බැවින්, එම සාමාජිකාව නැවත දිවයිනට පැමිණි පසුව අනුමැතිය ලබා ගෙන, 2021 වර්ෂයේ ගිණුම් වාර්තා 2022.06.15 දින ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

(ආ) 2019 සහ 2020 වර්ෂවලට අදාල වාර්ෂික වාර්තා 2022.06.16 වන දිනැති ලිපිය මගින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට පියවර ගනිමු.

(ඇ) මේ පිලිබඳව විමර්ශනය කිරීම සඳහා ආයතනය තුල විධිමත් විනය පරීක්ෂණයක් දැනට සිදු කෙරෙමින් පවතින අතර අවසාන අදියරේ පවතින එම පරීක්ෂණ කටයුතු 2022 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට අවසන් කිරීමට නියමිතව ඇත. එම විනිශ්චය සභාව විසින් ලබා දෙන නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගනිමු.

2.2.3

(අ)

**2018 වර්ෂයට අදාළ විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව**:

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතට අනුව, NASTEC ආයතනය පෙර වසරේ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව අදාළ වර්ෂයේ දත්ත ඊළඟ වසරේ රැස්කරනු ලැබේ. (2018 වාර්තාවට අදාළ දත්ත 2019 වර්ෂයේදී රැස් කෙරෙන අතර 2019 සඳහා දත්ත 2020දී හා 2021 දත්ත 2022 දී රැස්කරනු ඇත)

2019 ජූනි 11 වන දින පැවති කොමිෂන් සභා රැස්වීමේදී, පෙර වසරවල අනුගමනය කළ ව්‍යුහයෙන් බැහැරව ද්විතීයිය දත්ත භාවිතා කරමින් 2018 වසර සඳහා විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව සකස් කිරීම නව සැලැස්මක් අනුව කිරීමට NASTEC කොමිෂන් සභාව තීරණය කළේය. ඒ අනුව සමස්ත හා තාක්ෂණ ප්‍රජාව ඇතුළුව එම වාර්තාව සකස් කර 2020 වර්ෂය තුළ ප්‍රකාශනය කිරීමට තීරණය කරන ලදී. එම තීරණයට අනුව දත්ත රැස්කිරීමේ ප්‍රශ්නාවලිය පසුගිය වසරවල ක්‍රියාත්මක වූ පරිදි ක්‍රියාත්මක

නොවුණි. ඒ අනුව නව උපාය මාර්ගික සැලසුමකට අනුව අදාළ වාර්තාව සැකසීම සඳහා මග පෙන්වීමට කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත අතුරු කමිටුවක් පත් කරන ලද අතර, කමිටුවේ නිර්දේශය අනුව අදාළ ප්‍රශ්නාවලිය 2019 අගෝස්තු මාසයේදී ආයතන වෙත ලබා දීම සිදු කෙරුණි. ඇතැම් ආයතන විසින් දත්ත සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රශ්නාවලිය හරහා දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය 2020 ජනවාරි දක්වා ප්‍රමාද විය.

වාර්තාවේ ගුණාත්මක භාවය රඳා පවතින්නේ ආයතන ගණන අනුව සපයන දත්ත මත ය. එබැවින් නිසි සංඛ්‍යානමය විශ්ලේෂණයක් කිරීමට ආයතන බහුතරයක් තම දත්ත ලබාදෙන තෙක් බලා සිටීමට ආයතනයට සිදු විය. ඒ අනුව 2018 වර්ෂයට අදාළ වාර්තාවට දත්ත 2019 අගෝස්තු මාසයේ සිට 2020 ජූනි මාසය දක්වා එක්රැස් කර අතර, ඉන්පසු එම දත්ත විශ්ලේෂණය කර, 2018 වසරේ විද්‍යා හා තාක්ෂණ වර්ෂයේ තත්ත්ව වාර්තාව සම්පාදනය කිරීම අරඹන ලදී. නමුත් COVID-19 පැතිරීම හේතුවෙන් 2020 මාර්තු සිට ආයතනික මෙහෙයුම් නිවසේ සිට සිදු කිරීමට සිදු වූ නිසා අවසාන වාර්තාව සකස් කිරීමට බොහෝ කාලයක් ගත විය. අවසන් වාර්තාව 2021 අප්‍රේල් මාසයේදී කොමිෂන් සභාවට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව විසින් එම වාර්තාව අධ්‍යයනය කර අනුමැතිය ලබා දීම සිදු කළ යුතු නමුත්,2021 වර්ෂයේ සිට මේ දක්වා පැවති විවිධ ගැටළු සහගත තත්ත්වයන් (ස්ථිර සභාපතිවරයකු නොමැතිවීම, සාමාජිකයන් ඉල්ලා අස්වීම නිසා රැස්වීම් සඳහා සනපූරණය නොමැති වීම) මත එම කාර්යය සිදු කිරීමට නොහැකි විය.

ඒ අනුව, 2018 විද්‍යා හා තාක්ෂණ වාර්තාවේ කෙටුම්පත සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රකාශයට පත් කිරීමට නියමිතව ඇත. එසේම කොමිෂන් සභාව පත් කිරීම ප්‍රමාද වීම නිසා මෙම කාර්යය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් 2022.06.27 දිනැති ලිපියෙන් ඉල්ලා සිටින ලදී. දැනට මෙම කෙටුම්පත ආයතනයේ වෙබ් අඩවියේ උඩුගත කොට ඇත.

**2019, 2020 වර්ෂ වලට අදාළ විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව:**

2020.07.15 දින අමාත්‍යාංශයේදී පැවති NASTEC ආයතනයේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී එවකට උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් ලබා දුන් නිර්දේශ අනුව 2019 වර්ෂය සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලිය 2020 වසරේදී සිදු නොකරන ලද අතර 2019/2020 වර්ෂ දෙකම සඳහා අදාළ දත්ත රැස්කර වාර්තාවක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

2020 සහ 2021 දී රට තුළ පැවති COVID-19 වසංගතය රජයේ කාර්යාලවලට ඔවුන්ගේ උපරිම හැකියාවෙන් වැඩ කිරීමේ හැකියාවට දැඩි ලෙස බාධා කළ අතර නිවසේ සිට වැඩ කිරීමේදී අපගේ ප්‍රශ්නාවලියට අදාළ දත්ත ලබා දීමට අපහසු බව බොහෝ ආයතන විසින් දන්වන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2019 සහ 2020 වසර සඳහා දත්ත රැස් කිරීම, 2021 ඔක්තෝම්බර් මාසයේදී "නව සාමාන්‍ය" යටතේ ක්‍රියාත්මක වීමට රට සම්පූර්ණයෙන්ම විවෘත වූ පසු ආරම්භ කරන ලදී. ඒ අනුව එම වාර්තාවලට අදාළ දත්ත රැස් කිරීම මේ වන විට අවසන් ව පවතින අතර දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව අවසන් වාර්තාව සැකසීම සිදු කරනු ලැබේ. එක් ප්‍රශ්නාවලියක පිටු 14ක් වන අතර වසර දෙක සඳහා දත්ත ඇතුලත් කිරීම හා ඒවායේ නිරවද්‍යතාවය මැන බලා දත්ත ඇතුලත් කල යුතු බැවින් වාර්තාව සම්පූර්ණ කිරීමට යම් කාලයක් ගත කළ යුතු වේ. ඒ අනුව නිසි අනුමැතියන්ට යටත්ව මෙම වාර්තාව ඉක්මනින් සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත.

(ආ)

1994 අංක 11 දරණ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ඇ) වගන්තිය අනුව පනතේ 2 වගන්තියට අදාළව විද්‍යා හා තාක්ෂණ ආයතනවල ප්‍රගතිය සමාලෝචනය කිරීමට NASTEC ආයතනයට බලය ලැබී ඇත. එසේම මෙම සමාලෝචන සිදු කරනුයේ NASTEC සමාලෝචන අත්පොතේ (Review Manual) දක්වා ඇති මාර්ගෝපදේශ අනුවය. පනතට අනුව ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාළ නියෝග නිකුත් කිරීමට අප සතුව බලයක් නොමැත. ප්‍රතිපත්ති සම්පාදනය

කරන ආයතනයක් ලෙස විද්‍යා හා තාක්ෂණයට අදාළ ප්‍රතිපත්තිමය ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා සුදුසු ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දීම මෙම සමාලෝචන වල මූලික අරමුණ වන අතර අදාළ රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා අදාළ ආයතනයන් හි දායකත්ව මැන බලා සුදුසු ක්‍රියා මාර්ග සඳහා නියමිත ආයතන වෙත දැනුම් දීම වේ. මේ අනුව මෙම සමාලෝචන ක්‍රියාවලියේදී හඳුනාගත් ප්‍රතිපත්තිමය ගැටළු විවිධ අවස්ථාවන්හිදී අප විසින් ජාතික මට්ටමින් ඉස්මතු කොට ඇත.

උදා: කැබිනට් අනුමැතිය ලැබී ඇති ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවේ (NRDF) යෝජිත ප්‍රතිපත්ති, ගෘහස්ථ බීජ ප්‍රතිපත්තිය, ජාතික ආයුර්වේද ප්‍රතිපත්තිය.

2011 වර්ෂයේ සිට ආයතන සමාලෝචන කටයුතු ආරම්භ කර තිබුනද,2018 වර්ෂය දක්වා ලැබී ඇති ප්‍රතිපාදන සහ ආයතනයේ පැවැති සීමිත මානව සහ භෞතික සම්පත් අනුව බොහෝ විට සමාලෝචනය සිදු කර තිබුනේ වසරකට ආයතන 1-3 දක්වා ප්‍රමාණයකි.

2018 වර්ෂයේ එවකට අමාත්‍යාංශ ලේකම්තුමාගේ නිර්දේශය මත මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා NASTEC ආයතනය විසින් පියවර රැසක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

- ඒ අනුව ආයතන සමාලෝචනය සඳහා විද්වත් කමිටු සාමාජිකයන් පත් කිරීම සඳහා බාහිර සම්පත් දායකත්වයන්ගේ සංචිතයක් ඇති කිරීම සිදු කරන ලදී.
- ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ වර්ගීකරණය අනුව රජයට අනුබද්ධ විද්‍යා හා තාක්ෂණ ආයතන සිතියම් කිරීම (Mapping of state funded S & T Institutes). මේ අනුව 2018/2019 වර්ෂවල සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව ආයතන 66ක් හඳුනා ගැනීම සිදු කරන ලදී.
- ආයතන සමාලෝචනයේදී අදාළ ආයතන විසින් දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය NASTEC ආයතනය සතු නොවන බැවින් ඒ සඳහා යාන්ත්‍රණයක් සැකසීම සඳහා රජයේ විගණන දෙපාර්තමේන්තුව සමග 2020 වර්ෂයේදී සාකච්ඡාවක් සිදු කරන ලදී.ඒ අනුව විගණන දෙපාර්තමේන්තුව,තම විගණනයේදී එම ආයතන සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාලව විගණනයක් කිරීමට එකග විය.
- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය (SLCARP) ද කෘෂිකර්ම ආයතන සඳහා ආයතන සමාලෝචනය සිදු කරන බැවින් NASTEC ආයතනය මගින් කෘෂිකාර්මික ආයතන සමාලෝචනය සිදුකිරීමට යාමේදී සිදුවන ගැටළු නිරාකරණය කිරීම සඳහා NASTEC හා SLCARP අතර සාකච්ඡා මාලාවක් 2021 වර්ෂයේදී පවත්වන ලදී.

NASTEC ආයතනය මගින් සිදුකරන විද්‍යා තාක්ෂණ ආයතන වල සමාලෝචන ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම සහ පවතින ගැටළු අධ්‍යයනය කොට විසඳුම් ලබාදීම හා අදාළ සමාලෝචනය සිදු කරන ලද ආයතන ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂණය සඳහා ක්‍රියාවලියක් ඇරඹීමට 2021 වර්ෂයේදී කොමිෂන් අනු කමිටුවක් පිහිටුවන ලදී. එම අනු කමිටුව NASTEC ආයතනයේ දැනට පවතින තත්ත්වය (මූල්‍ය හා මානව) සහ මෙම ක්‍රියාවලිය දීර්ඝ ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු මෙම වෙනස්කම් කිරීම සිදු කල යුත්තේ NASTEC ආයතනය වෙත ස්ථිර සභාපතිවරයෙක් පත්කළ පසුය යන්න ප්‍රකාශ කරන ලදී. ඒ අනුව කොමිෂන් අනු කමිටුවේ නිර්දේශ මත මෙම කාර්ය නව සභාපතිවරයෙකු පත් කිරීමෙන් පසු ලබා දෙන නිර්දේශ මත සිදු කිරීමට නියමිතව ඇත. පනත ප්‍රකාරව වැඩ කටයුතු කිරීමට අවශ්‍ය අනුමැතියන් සඳහා ස්ථිර සභාපතිවරයකු පත් කර දෙන මෙන් ඉල්ලා 2021 සහ 2022 වර්ෂවල අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත විවිධ අවස්ථාවන්හිදී ඉල්ලීම් සිදුකොට ඇත.

(ඇ)

පනත ප්‍රකාරව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන IX වැනි ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව (BICOST IX) වසර දෙකකට වරක් පැවැත්විය යුතු අතර ඒ අනුව, 2018 නොවැම්බර් 8 සහ 9 යන දිනයන්හිදී ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් BMICH හිදී පැවැත්වීමට නියමිතව තිබුණි.

ඒ අනුව NASTEC ආයතනය විසින් 2018 වසරේ BICOST පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ සියලුම සංවිධාන කටයුතු සිදු කරන ලදී. කෙසේ වෙතත්, ජනාධිපති ලේකම්වරයාගේ වාචික උපදෙස් පරිදි එවකට පැවති දේශපාලන පසුබිම මත අවසන් මොහොතේ එනම් 2018 නොවැම්බර් 05 වැනි දින එම සමුළුව කල් දැමීමට සිදු විය. ආයතනයේ හිටපු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති කාර්ය මණ්ඩල රැස්වීමේදී මේ ගැන ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත නිල වශයෙන් දැනුම් දෙන ලදී.ඒ අනුව අවලංගු කිරීම සියලුම ආරාධිතයින්ට දැනුම් දෙන ලදී .

අනතුරුව, 2018 දෙසැම්බර් 10 වැනි දින පැවති 199 වැනි කොමිෂන් සභා රැස්වීම සඳහා මෙම සමුළුව තාවකාලිකව කල් දැමීම පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාවක් ද ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඉහත සමුළුව 2019 වසරේ මුල් භාගයේදී පැවැත්වීමට කොමිසම තීරණය කළේය.

නමුත් එවකට පැවති කොමිෂන් සභාව 2018 දෙසැම්බර් මාසයේදී විසුරුවා හරින ලදී. පසුව, අලුතින් පත් වූ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2019 මාර්තු 14 වැනි දින පැවැත්වූ 200 වැනි කොමිෂන් සභා රැස්වීමෙන් සමුළුව නැවත 2020 වර්ෂය දක්වා කල් දමන ලදී. එම අවස්ථාවේ දී කොමිෂන් සභාව ගත් තීරණ අනුව ක්‍රියා කිරීමට නිලධාරීන්ට සිදු විය.

2020 වසරේ කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් මෙම ක්‍රියාකාරකම නැවත දැනුම් දෙන තුරු කල් දැමීමට සිදු විය. මේ පිලිබදව දිගින් දිගට කොමිෂන් සභා රැස්වීම් වල සාකච්ඡා කල නමුත් පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හා කොමිෂන් සභාවේ  සභාපති ධූරය 2021 ජනවාරි මස සිට මේ දක්වා පුරප්පාඩුව පවතින බැවින් කොමිෂන් සභාවේ උපදෙස් පරිදි අදාළ කටයුතු ආරම්භ කිරීම සිදු නොවීය. 2021 ජනවාරි මාසයේ සිට මේ දක්වා කොමිෂන් සභාව සඳහා සභාපතිවරයකු නොමැති වීම මෙම ක්‍රියාකාරකම ආරම්භ කල නොහැකි වීමට සෘජුවම බලපා ඇත. ඒ අනුව,සභාපතිවරයකු පත් කිරීමත් සමඟ මෙම කටයුතු සැලසුම් කරනු ලැබේ.

2.3

(අ)

**ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ තනතුර (පුරප්පාඩු 01)**

ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ තනතුර 2020.12.21 පුරප්පාඩු වූ අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා 2021.01.18 දින යොමු කරන ලදී.

සමස්තයක් ලෙස ගත් කල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක:21/1596/304/134 "රාජ්‍ය වියදම් සමාලෝචනය"යන මැයෙන් මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 2021.08.28 දිනැති සංදේශය අනුව, කටයුතු කිරීමට ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් උපදෙස් ලැබී ඇත. එසේම 2021.12.21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 මගින් නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම තාවකාලිකව නතර කිරීමට ද උපදෙස් ලබා දී ඇත.

**කළමනාකරණ සහකාර තනතුර (පුරප්පාඩු 04)**

මුදල් අමාත්‍යාංශය මගින් 2019.11.20 දින අංක:DMS/Policy/Recruitments දරණ ලිපිය මගින් රාජ්‍ය ආයතනවල බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන ලදී.එනමුත් කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු කඩිනමින් සිදුකර ගැනීම සඳහා ද්විතීය මට්ටමේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා විශේෂ අනුමැතියක් ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් 2020.02.19 දින පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වා සිටි අතර අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට පිටපතක් සහිතව 2020.06.17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2020. 09. 25 වන දින තනතුරු 02 ක් සඳහා පමණක් අනුමැතිය ලබා දුනි. එම තනතුරු දෙකට අදාළ බඳවා ගැනීම් සිදුකිරීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීමට රටේ පැවති කොරෝනා වසංගත තත්වය මත ප්‍රමාද විය. කෙසේ නමුත් අදාළ බඳවා ගැනීම් සඳහා 2021 ජනවාරි මස 24 වන දින පුවත්පත් දැන්වීම පළ කළ අතර නැවත වතාවක් කොරෝනා වසංගත තත්වය සහ සංචරණ සීමා හේතුවෙන් බඳවා ගැනීම් ප්‍රමාද විය.

**කාර්යාල කාර්ය සහයක තනතුර (පුරප්පාඩු 01)**

ප්‍රාථමික මට්ටමේ පවතින තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට 2020.09.21 වන දින අමාත්‍යාංශය වෙත දන්වා සිටි අතර අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාවට පිටපතක් සහිතව 2020.10.15 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කර තිබුණි. කෙසේ නමුත් භාණ්ඩාගාර ලේකම්ගේ අංක: DMS/Policy/Recruitments හා 2020.02.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව සියලුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් අත්හිටුවා ඇත. තවද අමාත්‍යාංශය විසින් දන්වා සිටි පරිදි ප්‍රාථමික සේවා ගණයේ පුරප්පාඩු පිරවීම සඳහා බහු කාර්ය සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරවා ගැනීමට තීරණය කර ඇති බැවින් ඊට අදාළ ඉල්ලුම් පත 2020.10.21 වන දින අමාත්‍යාංශය වෙත ද යොමු කරන ලදී.

තවද, ආයතනයේ මනා පැවැත්ම සඳහාත් පනතට අනුව ඉටු කල යුතු කර්තව්‍යයන් ඉටු කිරීම සඳහාත් 2022.02.09 වන දින අංක: NASTEC/07/CADRE දරණ ලිපිය මගින් අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට විශේෂ අනුමැතියක් ලබා ගැනීම වෙනුවෙන් ද ඉල්ලීමක් කර ඇත.

මේ වනවිට 2022.08.08 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 04/2022 අනුව බඳවා ගැනීම් සියල්ල තාවකාලිකව අත්හිටුවා ඇත.

(ආ)

**කෙටුම් පත් කර ඇති ප්‍රතිපත්ති 05 සඳහා අනුමැතිය**:

2018 සිට 2021 වර්ෂය දක්වා කාලය තුල වරින් වර කොමිෂන් සභාවේ සභාපති තනතුර සහ කොමිෂන් සභා සාමාජිකයන්ගේ වෙනස් වීම් ( 2018-2021 දක්වා විවිධ කාල සීමාවන් සඳහා සභාපතිවරු 05ක් සහ කොමිෂන් සභා 03 සිටින ලදී) මත සහ 2021 වසරේ පූර්ණ කාලීන සභාපතිවරයෙකු නොමැති වීම හේතුවෙන් කෙටුම්පත් තත්ත්වයේ පැවති ප්‍රතිපත්ති සහ සමාලෝචන වාර්තා සම්බන්ධයෙන් වරින්වර කොමිෂන් සභාවේ මතු වූ අදහස් හා යෝජනා මත ඉදිරි කටයුතු සඳහා

එම වාර්තා වලට අදාළ අවසන් අනුමැතිය ලබාගැනීමට නොහැකි විය. ඒ අනුව මෙම කාර්යය නව සභාපතිවරයෙකු පත්කිරීමෙන් පසු ලබා දෙන නිර්දේශ මත සිදු කිරීමට නියමිතව ඇත.

**කෙටුම් පත් කර ඇති සමාලෝචන වාර්තා 06 සඳහා අනුමැතිය:**

අදාළ සමාලෝචන වාර්තා ආයතනය වෙත සම්පූර්ණ කොට ආයතනය වෙත ලැබුණේ 2021 අවසන් කාර්තුවේ අවසන් භාගයේදීය.ඒ වන විට කොමිෂන් සභාවේ සනපූරණය නොමැති බැවින් කොමිෂන් සභා රැස්වීම් නොපැවතුණි. සමාලෝචන ක්‍රමවේදයට (protocol) අනුව ඉදිරි පියවර සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. දැනට පවතින තත්ත්වය අනුව අදාළ අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා එවකට තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත ලිපි 2021.12.14 සහ 2022.04.22 දිනයන්හී ඉදිරිපත් කරන ලදී.ඒ සඳහා නිසි පිළිතුරක් නොලැබුණ අතර දැනට NASTEC ආයතනය අයත් වන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙම ගැටළුව සම්බන්ධයෙන් 2022.06.27 දින යොමු කරන ලද ලිපියෙන් මෙම වාර්තාවල ඉදිරි කටයුතු සිදු කිරීමට අදාළව උපදෙස් ඉල්ලා ඇත. ඒ අනුව ලබා දෙන නිර්දේශ මත ඉදිරියට කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

ජනක එස්. ගීකියනගේ<br>
වැ.බ.අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි<br>
සභාපති වෙනුවට